නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சு

Ministry of Urban Development, Construction and Housing









වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

வருடாந்த செயல்திறன் அறிக்கை 2024

Annual Performance Report 2024



රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 අනුකූලව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන

2024	වාර්ෂික කාර්යසාධන වාර්තාව

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

වැය ශීර්ෂය: 123

12 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල
දුරකථන :0112877002
ෆැක්ස් : 0112080639

විද්‍යුත් තැපෑල: secretary@moudh.gov.lk

වෙබ් අඩවිය: www.moudh.gov.lk

පටුන

පරිච්ඡේදය		පිටුව
01	**පරිච්ඡේදය 01: ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	**1-6**
1.1	හැඳින්වීම	1
1.2	අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර	2
1.3	අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්	2-3
1.4	අමාත්‍යාංශයීය සංවිධාන සටහන	4
1.5	2024 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු	5
1.6	2024 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ රාජ්‍ය සංස්ථා	5
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	6
02	**පරිච්ඡේදය 02: 2024 වර්ෂයෙහි ප්‍රගතිය සහ 2025 වර්ෂයෙහි ඉදිරි දැක්ම**	**7-31**
1.0	2024 වසරේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් වෙන්වූ අරමුදල්වල සමස්ත මූල්‍ය ප්‍රගතිය	7-9
2.0	සමස්ථ භෞතික ප්‍රගතිය	9-28
2.1	ජාතික, පළාත්, නාගරික සහ ප්‍රාදේශීය භෞතික සැලසුම්කරණය	9-10
2.2	නාගරික භෞතික සංවර්ධනය (නාගරික සංවර්ධන ව්‍යාපෘති)	11-15
2.3	නිවාස සංවර්ධනය	15-20
2.4	අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම	20-21
2.5	තිරසර පරිසරයක් නිර්මාණය කිරීම	22-24
2.6	විශේෂ ව්‍යාපෘති	24-26
2.7	ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනය	27-28
3.0	අමාත්‍යාංශයේ සාමාන්‍ය පාලන කටයුතු	28-29
4.0	අධීක්ෂණය හා ඇගයීම	30-31
5.0	අභ්‍යන්තර විගණනය	31
03	**පරිච්ඡේදය 03: 2024 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**	**32-37**
3.1	මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය	32
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	33
3.3	මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය	34
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	35
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	36
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	36
3.7	මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයතු ලෙස මෙම දෙපාර්තමේන්තුවලට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	36
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	37
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	37
04	**පරිච්ඡේදය 04: කාර්යසාධන දර්ශක**	**38**
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැකැස්ම මත පදනම්ව)	**38**
05	**පරිච්ඡේදය 05: තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය**	**39-42**
5.1	හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.	39-41
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.	41-42

06	**පරිච්ඡේදය 06: මානව සම්පත් පැතිකඩ**	**43-44**
	6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	43
	6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.	43
	6.3 මානව සම්පත් සංවර්ධනය	43-44
07	**පරිච්ඡේදය 07: අනුකූලතා වාර්තාව**	**45-49**

පරිච්ඡේදය 1
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2024 නොවැම්බර් මස 25 වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2412/ 08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන, ඉදිකිරීම සහ නිවාස අමාත්‍යාංශය පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතන 19ක ප්‍රමාණයකින් සමන්විත විය.

1. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
3. රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
4. නාගරික සංවර්ධන අධිකාරිය
5. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
6. සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
7. හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම
8. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
9. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
10. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
11. සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
12. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
13. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
14. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
15. ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
16. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
17. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
18. ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව
19. කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ්

එසේවුවද, 2024.09.27 දිනැති අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව පෙර පැවති නාගරික හා නිවාස අමාත්‍යාංශයේ විෂය පථය, ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය යටතට පත්වූ අතර වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යන ආයතන නව අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් කරන ලදී.

2024.11.25 දිනැති අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් නිවේදන මගින් නාගරික සංවර්ධන, ඉදිකිරීම සහ නිවාස අමාත්‍යාංශයෙහි විෂය පථය යටතට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව සහ කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් යන දෙපාර්තමේන්තු හා ආයතන ද ඇතුලත්විය.

1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

1.2.1 දැක්ම

ලස්සන නගරයක් සහ සුවපහසු ජීවිතයක්

1.2.2 මෙහෙවර


නාගරික සංවර්ධනය ක්‍රමවත් කිරීම, නිවාස සහ යටිතල පහසුකම් ලබාදීම, භෞතික සැලසුම්කරණය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවේශය තහවුරු කිරීම, ගංවතුර පාලනය සහ තෙත්බිම් කළමනාකරණය, ඉඩම් සංවර්ධනය සහ සභාධිපත්‍ය කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට ලස්සන නගර සහ සුවපහසු ජීවිතයක් සඳහා ප්‍රවේශය සැලසීම.

1.3 අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන, ඉදිකිරීම්, ජල සැපයුම් හා නිවාස යන විෂයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම සහ තාක්ෂණය යොදාගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය.
5. නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.
6. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය
7. නාගරික ප්‍රදේශය තුළ දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා පුද්ගලික අංශය උනන්දු කරවීම හා මෙම ප්‍රයත්නය සඳහා සුදුසු ඉඩම් ලබා දීම.
8. නාගරික ප්‍රදේශවල දැරිය හැකි මිලකට නිවාස ව්‍යාපෘතීන් ලබා ගැනීම සඳහා විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ආයෝජනයන් කිරීම ප්‍රවර්ධනය කිරීම.
9. රජයේ මැදිහත්වීමෙන් කොළඹ ප්‍රදේශයේ අඩු ආදායන්ලාභී ජනාවාසයන්හි පදිංචිකරුවන්හට දැරිය හැකි මිලකට නිවාස ලබා ගැනීමට පහසුකම් සැපයීම.
10. නාගරික හා අර්ධ- නාගරික ප්‍රෙද්ශයන්හි අත්‍යවශ්‍ය පහසුකම් සහිත විස්තීරණ නිවාස සංවර්ධනය කිරීම.
11. නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලුවලට විසඳුම් ලබා දීමට අදාළ නීති සංශෝධනය කිරීම.
12. නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
13. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම.
14. සියලුම නාගරික ඉදිකිරීම් නියාමනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම.
15. සියලු නාගරික ඉදිකිරීම් වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇති කිරීම සහතික කිරීම.
16. ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙල කිරීම.

17. ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදු කිරීම.
18. සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
19. මහජන සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.
20. පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනයට අදාළ කටයුතු.
21. නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩු ප්‍රදේශ සහ වගුරුබිම් පොදු සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම.
22. රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියම කිරීම.
23. අඩු ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
24. පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මග පෙන්වීම.
25. රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.
26. අදාළ නීති රීති හා ප්‍රමිතීන් වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
27. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශන හා නියාමන සේවා සැපයීම.
28. බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.
29. ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම.
30. දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම.
31. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ උපකොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම.
32. සුදුසු හා තිරසාර තාක්ෂණය යොදා ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රෙද්ශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
33. ජාතික සංවර්ධන ඉලක්කයන් ලගාකර ගත හැකි වන පරිදි ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නවීන ඉංජිනේරු උපදේශන සේවාවන් ලබාදීම.
34. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.
35. ජලසම්පාදන සේවා, ජලවහන පද්ධති සහ සනීපාක්ෂක පහසුකම් පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව නව සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව
36. ග්‍රාමීය වැව්, ජලාශ හා වාරිමාර්ග පද්ධතීන් සම්බන්ධීකරණය කරමින් ජල සුරක්ෂිතතාව සහ නාගරික ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම.
37. පානීය ජලය බෙදා හැරීමේදී සිදුවන ජලය අපතේ යාම වළක්වා ගැනීම.
38. ප්‍රජා ජල සම්පාදනහා ව්‍යාපෘති කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම සඳහා පියවර ගැනීම.
39. ග්‍රාමීය ජනතාවට ප්‍රමිතායෙන් යුතු පානීය ජල සැපයීම සඳහා ප්‍රජා ජල සැලයුම් ව්‍යාපෘති නඩත්තු කිරීම හා දියුණු කිරීම.
40. ජලාශ සංවර්ධනය හරහා ග්‍රාමීය පළාතිවල පානීය ජල සැපයුම ස්ථාවර කිරීම
41. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
42. අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

1.4 අමාත්‍යාංශයීය සංවිධාන සටහන



සැ.යු. / අංශ අනුව තවදුරටත් බෙදා වෙන්කර දක්වනු ලබන සංවිධාන සටහන ඇමුණුම-1 මගින් සිංහල බසින් ඉදිරිපත් කර ඇත.

1.5 2024 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති දෙපාර්තමේන්තු

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

1.6 2024 වර්ෂය තුල අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ රාජ්‍ය සංස්ථා

- නාගරික සංවර්ධන අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
- හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
- ඕෂන්වීව් ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව
- කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිත ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම	ව්‍යාපෘතියේ කාල සීමාව
01	නාගරික ව්‍යාපෘති සැකසීමට පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	රු.මිලි. 1, 146 (ඇ.ඩො.මිලි. 6.42)	2019-2024
02	අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය	ප්‍රංශ නියෝජිත ආයතනය	රු.මිලි. 10,125 (යූරෝ මිලි. 62.4)	2016-2025
03	කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	රු.මිලි. 5,2571.67 (ඇ.ඩො. මිලි. 158)	2019-2025
04	චීන රජයේ ආධාරමත අඩුආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය	මහජන චීන සමූහාණ්ඩුව	රු.මිලි. 28,847.39 (රෙන්මින්බි මිලි. 552)	2022-2027
05	ඉන්දියානු නිවාස ප්‍රදාන වැඩසටහන			
5.1	දීපව්‍යාප්ත - 2017	ඉන්දියානු ජනරජය	රු.මිලි. 300.00	2017-2024
5.2	ග්‍රාම ශක්ති - දකුණු පළාත (අදියර I)		රු.මිලි. 300.00	2017-2024
5.3	ග්‍රාම ශක්ති - දකුණු පළාත (අදියර II)		රු.මිලි. 300.00	2019-2024
5.4	ග්‍රාම ශක්ති - උතුරු පළාත		රු.මිලි. 300.00	2019-2024
06	පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ඉදිකිරීම		රු.මිලි. 450.50	2017-2025
07	"මන්නාරම මඩු දේවස්ථාන පරීශ්‍රයේ සංක්‍රමණ නිවාස" ඉදිකිරීමේ ව්‍යාපෘතිය		රු.මිලි. 290.08	2020-2025

පරිච්ඡේදය 2
2024 ප්‍රගතිය සහ 2025 ඉදිරි දැක්ම

1.0. 2024 වසරේ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් වෙන්වූ අරමුදල්වල සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන/ ව්‍යාපෘතිය		ප්‍රතිපාදන - 2024	වියදම් - 2024.12.31 දිනට	%
නාගරික සංවර්ධන				
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය		58,000,000.00	57,624,999.02	99.35
කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය		292,000,000.00	253,746,123.19	86.90
උපායමාර්ගික නගර සංවර්ධනය - යාපනය		150,000,000.00	53,743,508.09	35.83
උපායමාර්ගික නගර සංවර්ධනය - අනුරාධපුර නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම		995,910,088.00	303,272,743.69	30.45
නාගරික පුනර්ජීවන වැඩසටහන		7,000,000,000.00	4,712,644,978.68	67.32
නාගරික පුනර්ජීවන වැඩසටහනට සහාය වීමේ ව්‍යාපෘතිය	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	8,000,000,000.00	5,546,072,223.64	69.33
	ශ්‍රී ලංකා රජය	595,000,000.00	580,062,350.58	97.49
නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම	ආසියානු සංවර්ධන බැංකුව	20,000,000.00	9,017,289.21	45.09
	ශ්‍රී ලංකා රජය	300,000,000.00	-	-
සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රජය	175,000,000.00	158,730,527.00	90.70
	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය	829,000,000.00	828,247,689.91	99.91
හෝමාගම කලාපයේ (තාක්ෂණික නගරය) මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම		500,000,000.00	349,516,681.22	69.90
යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම		400,000,000.00	183,496,891.60	45.87
සියක් නගර/ නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන		800,000,000.00	776,683,236.89	97.09
නාගරික සංවර්ධන අධිකාරිය - රාජ්‍ය ආයතන		400,000,000.00	350,000,000.00	87.50
කොළඹ අගනගර සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය		3,805,511,700.00	1,895,616,874.92	49.81
නැගෙනහිර සහ බස්නාහිර පළාත් සහ හම්බන්තොට සංවර්ධනය සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම		600,000,000.00	297,630,382.15	49.61
තිරසාර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	1,500,000,000.00	-	-
	ශ්‍රී ලංකා රජය	180,000,000.00	438,627.50	0.24
අඩු ආදායම්ලාභීන් සඳහා වීන ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 2,000ක් ඉදිකිරීම	මහජන වීන සමූහාණ්ඩුව	2,776,000,000.00	2,776,000,000.00	100.00
	ශ්‍රී ලංකා රජය	200,000,000.00	158,984,868.30	79.49
පුනරීන් නගර සංවර්ධනය		500,000,000.00	-	-
බණ්ඩාරවෙල ආර්ථික මධ්‍යස්ථානය අදියර 1		250,000,000.00	-	-
විසල් මිහින්තලේ නගර සංවර්ධනය		200,000,000.00	-	-
ගාලු දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය		250,000,000.00	-	-
පැලියගොඩ මැනිං වෙළඳපොල නැවත ස්ථාපනය කිරීම.		180,000,000.00	94,463,489.27	52.48
ගරු ජනාධිපතිතුමාගේ 2024 අයවැය යෝජනාවලට අනුව නාගරික නිවාස හිමිකම යටතේ අඩු ආදායම්ලාභී නිවාස 50,000ක් සඳහා පූර්ණ අයිතිය ලබා දීමේ		515,000,000.00	48,982,407.91	9.51

වැඩසටහන.				
කඳුකර දශකය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන		10,000,000,000.00	8,764,815,809.30	87.65
උප එකතුව - නාගරික සංවර්ධන		**41,471,421,788.00**	**28,199,791,702.07**	**68.00**
නිවාස				
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	මෘදුකාංග සංවර්ධනය	10,000,000.00	6,787,950.00	67.88
	කල්බදු වාහන සඳහා ප්‍රාග්ධන ගෙවීම	30,000,000.00	-	-
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය - රාජ්‍ය ආයතනය	පුහුණු මධ්‍යස්ථානය නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	10,000,000.00	10,000,000.00	100.00
	ඉදිකිරීම් උපකරණ යාන්ත්‍ර විද්‍යාව පුහුණුව	16,000,000.00	15,997,000.00	99.98
අනුරාධපුර සෝභිත හිමි ගම්මානයේ නිවාස ඉදිකිරීම	ඉන්දියානු ප්‍රදාන	181,250,000.00	81,930,947.47	45.20
	ශ්‍රී ලංකා රජය	110,000,000.00	15,849,984.80	14.41
ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 600 ක් ඉදිකිරීම		1,680,000.00	1,680,000.00	100.00
දකුණු පළාතේ නිවාස ව්‍යාපෘති (නිවාස 600) - 2017		3,570,000.00	3,570,000.00	100.00
ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ නිවාස ව්‍යාපෘති (නිවාස 600) - 2019		6,200,000.00	6,200,000.00	100.00
දකුණු පළාතේ නිවාස ව්‍යාපෘතිය අදියර II (නිවාස 600) - 2019		7,300,000.00	7,300,000.00	100.00
නිවාස යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම		20,000,000.00	20,000,000.00	100.00
එක්සත් ජාතීන්ගේ ජනාවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම		2,900,000.00	1,195,352.40	41.22
මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය		10,000,000.00	10,000,000.00	100.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම		10,000,000.00	10,000,000.00	100
ගල්කුලම ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන හා පුහුණු යටිතල පහසුකම්		20,000,000.00	13,612,178.93	68.06
ගැටුම්වලින් පීඩාවට පත් පවුල් සඳහා නැවත පදිංචි කිරීම/ස්ථිර නිවාස	සංවර්ධන සහාය	2,000,000,000.00	1,798,221,603.22	89.91
	වෙනත්	500,000,000.00	290,535,182.81	58.11
"සැමට නිවහන" නිවාස වැඩසටහන (ඔබට ගෙයක් රටට හෙටක්)		2,041,100,000.00	2,041,100,000.00	100.00
බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන		60,966,500.00	57,574,477.61	94.44
මරඳගහමුල සහල් ගබඩා සංකීර්ණයේ සහල් අලෙවි කුටි 115ක් ඉදිකිරීමේ ඉතිරි කටයුතු අවසන් කිරීම		14,590,000.00	12,086,299.13	82.84
මන්නාරමේ අඩු වියදම් නිවාස ඒකක 300ක් ඉදිකිරීම	ඉන්දියානු ප්‍රදාන	224,000,000.00	66,713,658.69	29.78
	ශ්‍රී ලංකා රජය	45,000,000.00	12,221,346.47	27.16
උප එකතුව - නිවාස		**5,324,556,500.00**	**4,482,575,981.53**	**84.19**
අපද්‍රව්‍ය කළමනාකරණය සහ පරිසර ආරක්ෂණය				
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව - ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්		1,566,325,400.00	1,565,967,400.00	99.98
වේරළුස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය		800,000,000.00	800,000,000.00	100.00
බේරේ වැවේ ජල ගුණාත්මකභාවය ප්‍රතිසංස්කරණය කිරීම		62,208,100.00	62,208,100.00	100.00
ඔලියමුල්ල වැසි ජල අපවහනය සහ පරිසරය වැඩිදියුණු කිරීම		730,553,000.00	729,666,007.92	99.88
කොළොන්නාව වැසි ජල අපවහනය සහ පරිසරය වැඩිදියුණු කිරීම		485,810,800.00	457,612,819.56	94.20

කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වැසි ජල පොම්පාගාර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.	114,000,000.00	-	-
ගංවතුර ආපදා සඳහා සූදානම් වීම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම	5,123,412.00	-	-
උප එකතුව - අපද්‍රව්‍ය කළමනාකරණය සහ පරිසර ආරක්ෂණය	3,764,020,712.00	3,615,454,327.48	96.05
සමස්ත එකතුව	**50,559,999,000.00**	**36,297,822,011.08**	**71.79**

2.0. සමස්ථ භෞතික ප්‍රගතිය

2.1. ජාතික, පළාත්, නාගරික සහ ප්‍රාදේශීය භෞතික සැලසුම්කරණය

2.1.1. ජාතික, පළාත් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සංවර්ධනය

ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීන, සුරක්ෂිත, සුහුරු සහ ප්‍රියජනක පරිසරයක් සඳහා විස්තීරණ, යාවත්කාලීන සහ බලාත්මක කළ හැකි සැලසුම් රාමුවක් ක්‍රියාත්මක කරන සංවිධානයක් ලෙස කටයුතු කිරීමේ අරමුණින් ස්ථාපිත ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් සැලැස්ම සැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනාගනිමින් ද, පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද, තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීමටත්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් නොකරන ලද ප්‍රදේශයන් හි පළාත් පාලන ආයතනවල ඉල්ලීම මත ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමත් සිදු කෙරේ.

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්ම වැඩිදියුණු කිරීම 2024 වර්ෂය අවසන් වන විට 98%ක ප්‍රගතියක් ලභා කරගෙන ඇත. නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 සකස් කිරීමේ භෞතික ප්‍රගතිය 95%ක් සහ මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 සකස් කිරීම 65%ක් ලෙස හඳුනාගත හැකිවිය. තවද, මධ්‍යම පාරිසරික අධිසංවේදී කලාපය තුළ සැලසුම් කටයුතු සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ කටයුතු ඇරම්භ කර ඇත. ප්‍රාදේශීය සභා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීමේ භෞතික ප්‍රගතිය 90% කි.

සැලසුම් සකස් කිරීම - ඉදිරි ඉලක්ක

- ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්ම සඳහා අදාල අනුමැතීන් ලබා ගැනීම සහ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- ප්‍රාදේශීය හෝ කලාපීය භෞතික සැලසුම් අධිකාරීන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් මාර්ගෝපදේශ සකස් කිරීම.
- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 සඳහා අදාල අනුමැතීන් ලබා ගැනීම සහ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම 2035 සකස් කිරීම සහ අදාල අනුමැතීන් ලබා ගැනීම
- ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය 2021-2048 හි සඳහන් මධ්‍යම අධිසංවේදී කලාපය සඳහා සැලසුම් සකස් කිරීම ආරම්භ කිරීම.

2.1.2. නාගරික සංවර්ධන සැලසුම් සංවර්ධනය සහ ප්‍රකාශයට පත් කිරීම

1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ (සංශෝධිත) II කොටසේ 8A (1) වගන්තියේ විධිවිධාන යටතේ, විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද නාගරික බල ප්‍රදේශවල ආර්ථික, සමාජීය, පරිසර සහ භෞතික සංවර්ධනය සඳහා ඒකාබද්ධ සැලසුම් ප්‍රවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය පැවරේ.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2024 වර්ෂයේ සංවර්ධන සැලසුම් 22ක් ප්‍රකාශයට පත්කිරීමට ඉලක්ක කර තිබූ අතර ඒ අතුරින් මොණරාගල හා හැටන් නගර සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කටයුතු අවසන් කොට ඇත. කඩුවෙල, පොල්ගහවෙල, ගම්පහ, අම්පාර, කුණ්ඩසාලේ, නාවලපිටිය, බද්දේගම හා හොරණ නගර සංවර්ධන සැලසුම් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති අතර මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මහ මාතර, පානදුර, කටාන, එරාවූර්, ගම්පොළ, සීතාවක, මඩකලපුව හා හික්කඩුව නගර සංවර්ධන සැලසුම් ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. පුත්තලම හා කෑගල්ල නගර සංවර්ධන සැලසුම් නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. කොටිකාවත්ත - මුල්ලේරියාව හා මහා යාපනය නගර සංවර්ධන සැලසුම් ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

එහෙත්, හිඟුරක්ගොඩ, මාවනැල්ල, කොටිකාවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල සංවර්ධන සැලසුම් ප්‍රකාශයට පත්කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතන මගින් එකඟතාවය නොලැබීම හේතුවෙන් අපේක්ෂිත දිනට ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වී ඇත. 2025 වර්ෂය සඳහා නගර සංවර්ධන සැලසුම් 28ක් ප්‍රකාශයට පත්කිරීමට ඉලක්ක කොට ඇත.

2.1.3. බස්නාහිර ප්‍රදේශ මහානගර ප්‍රධාන සැලැස්ම, නැගෙනහිර පළාත් උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්ම හා හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය

බස්නාහිර ප්‍රදේශ ප්‍රධාන සැලැස්ම නැවත සමාලෝචනය, නැගෙනහිර පළාතේ උපාය මාර්ගික සංචාරක කලාපය සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්ම නිර්මාණය කිරීම, හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලැස්ම නිර්මාණය කිරීමේ මූලික අරමුණින් ස්ථාපිත කරන මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයනු ලබන්නේ සිංගප්පූර්වේ සර්බානා ජුරෝංග් පුද්ගලික ආයතනයයි. මේ සඳහා ප්‍රතිපාදන ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් ලබාදෙන අතර නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත ජාතික මෙහෙයුම් කමිටුව එම සැලසුම් සමාලෝචනයට ලක්කර අනුමැතිය ලබා දේ.

ඒ අනුව, නැගෙනහිර පළාත සඳහා සංචාරක ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම හා බස්නාහිර ප්‍රදේශය සඳහා මහානගර ප්‍රධාන සැලැස්ම නැවත සමාලෝචනය අවසන් අදියරේ පවතී. හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා අවසන් කරන ලද ව්‍යුහ සැලැස්ම සහ හඳුනාගත් ප්‍රධාන වර්ධන මධ්‍යස්ථාන හයක් සඳහා සවිස්තරාත්මක ප්‍රධාන සැලසුම් කෙටුම්පත් කිරීම සිදුකරමින් පවතින අතර 2024 වර්ෂය තුල සමස්ථ ව්‍යාපෘතිය සඳහා රු. මිලි. 600.00ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර වැය කර ඇති මුදල රු. මිලි. 297.63කි.

2.2. නාගරික භෞතික සංවර්ධනය (නාගරික සංවර්ධන ව්‍යාපෘති)

නාගරික සංවර්ධන අධිකාරියේ 2024 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නගර සැලසුම්කරණය, බලාත්මකකරණය, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඉඩම් හා දේපොළ සංවර්ධනය හා කළමනාකරණය, නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙම ප්‍රධාන කාර්යන් සුමටව කරගෙන යාම සඳහා අවශ්‍ය සේවාවන් (මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හා ප්‍රගති සමාලෝචන) ලෙස මූලධර්ම 6ක් යටතේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය මැනීම සිදුකරනු ලැබේ. 2024 වර්ෂයට අදාළව මීට අදාළ සමුච්චිත ප්‍රගතිය 70%ක් ලෙස වාර්තා වී ඇත.

2.2.1. "සියක් නගර" නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන

2024 වර්ෂයේ දී "සියක් නගර" නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන තුළ නගර සැලසුම්වලට අනුව මධ්‍යම, නැගෙනහිර, උතුරු, වයඹ, සබරගමුව, දකුණ හා බස්නාහිර යන පළාත් 8 ආවරණය වන පරිදි ව්‍යාපෘති 14ක් ඇතුළත් වන අතර එහි ප්‍රධාන අවධානය බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ, නගර අලංකරණය, ඇවිදින මං තීරු, වෙරළ, කෘෂි හා නාගරික උද්‍යාන, පාසැල් ගොඩනැගිලි, බහුකාර්යය ගොඩනැගිලි හා නාගරික උද්‍යාන වැනි නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමු කෙරේ.

සියක් නගර වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 2,458.44ක් වන අතර 2024 වර්ෂය සඳහා රු.මිලි. 800.00ක ප්‍රතිපාදන වෙන් කොට ඇත. 2024.12.31 දින වන විට ව්‍යාපෘති 12ක කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘති 2ක කටයුතු සිදුකෙරෙමින් පැවති අතර 2024 වසරේ මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 776.68ක් වේ.

2.2.2 නාගරික සංවර්ධන අධිකාරිය - පොදු ආයතන

මෙම වැඩසටහන තුළ නගර සැලසුම්වලට අනුව නැගෙනහිර, වයඹ හා සබරගමුව යන පළාත් 3 ආවරණය වන පරිදි ව්‍යාපෘති 4ක් ඇතුළත් වන අතර එහි ප්‍රධාන අවධානය බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ, රථගාල් හා පදික පහසුකම් හා වතු නිවාස වැනි නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි යොමු කෙරේ.

මෙම වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 936.66ක් වන අතර 2024 වර්ෂය සඳහා රු.මිලි. 400.00ක ප්‍රතිපාදන වෙන් කොට ඇත 2024.12.31 දින වන විට එක් ව්‍යාපෘතියක කටයුතු අවසන් කර ඇත. ව්‍යාපෘති 3ක කටයුතු සිදුවෙමින් පැවති අතර 2024 වසරේ මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 350.00ක් වේ.

2.2.3 යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපාකිය

යාපනය මහනගර සභා කාර්යාලය ලෙස භාවිතා කළ පැරණි යාපනය නගර ශාලා ගොඩනැගිල්ල 1939 දී ඉදිකරන ලද්දක් වන අතර 1985 දී ඇති වූ සන්නද්ධ අරගලයේ දී එය සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය. එතැන් සිට, යාපනය මහනගර සභාව නල්ලූර් කෝවිලට අයත් ඉඩමක තාවකාලිකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර නගර සභාවේ බොහෝ අංශ තවමත් විවිධ ස්ථානවල විසිරී පවතී.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේ දී දේශීය අරමුදල් යොදා ගනිමින් නව නගර ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ වන විට මෙම ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 2,548.47කි. 2024 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 1,819.57ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 85%කි. යාපනය නගර ශාලාව ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියරේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. එහි දෙවෙනි අදියර ද සම්පූර්ණ කර යාපනය නගර සභාව වෙත භාර දිය යුතුව ඇත. ඒ අනුව දෙවන අදියරේ විදුලි සෝපානය ස්ථාපිත කිරීම, වායු සමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීම හා ගිනි ආරක්ෂක පද්ධතිය ස්ථාපිත කිරීම වැනි හඳුනාගත් වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහා නව මිල ගනන් අනුව ඇස්තමේන්තුගත පිරිවැය සංශෝධනය කළ යුතුව ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැති ලබා ගත යුතුය.

මෙම ව්‍යාපාතිය සඳහා ඒ ඒ වර්ෂයන් තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් නොලැබීම හා ප්‍රතිපාදන වෙන්කිරීම වසර 04ක් තුළ බෙදී යන පරිදි අනුමත වී තිබූ නමුත් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වසර 02ක් තුළ නිම කරන ලෙස පවරා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය කිහිප වරක් දීර්ඝ කිරීමට සිදුවීම හේතුවෙන් නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම අභියෝගයක් විය.

2.2.4. <u>බණ්ඩාරවෙල ආර්ථික මධ්‍යස්ථානය - අදියර 1</u>

අදියර I යටතේ 2024 වසර තුළ සැලසුම් කටයුතු, අදාළ අනුමැතීන් ලබා ගැනීම සහ ඉඩම් සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම අපේක්ෂා කළ අතර ඒහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 250.00කි. මෙම ව්‍යාපෘතිය තවමත් සැලසුම් අදියරේ පවතින අතර අනුමැතීන් ලබා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. විවෘත ලංසු කැඳවීම හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. 2024 වර්ෂය අවසාන වන විට අදියර Iහි සමුච්චිත භෞතික ප්‍රගතිය 30%කි.

2.2.5. <u>පූනරින් නගර සංවර්ධනය</u>

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි. 500ක් වන මෙම ව්‍යාපාතියේ සැලසුම් කටයුතු, අදාළ අනුමැතීන් ලබා ගැනීම සහ ඉඩම් සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම 2024 වර්ෂයේ දී අපේක්ෂා කළ අතර 2024 වර්ෂය අවසාන වන විට සමුච්චිත භෞතික ප්‍රගතිය 21%ක වන අතර සැලසුම් කටයුතු හා අනුමැතීන් ලබා ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

2.2.6. <u>හෝමාගම කලාපයේ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම</u>

2019 වසරේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපාතිය යටතේ කොට්ටාව සිට මාහේන්වත්ත දක්වා නව ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සිදුකරනු ලබයි. 2024 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 1,373.83ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 98%කි. ප්‍රවේශ මාර්ගයේ මුළු දිග මීටර් 800ක් වන අතර මීටර් 750ක කටයුතු මේ වන විට අවසන් කර ඇත. ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු හේතුවෙන් ඉතිරි මීටර් 50ක ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇත.

2.2.7. <u>නාගරික ව්‍යාපෘති සැකසීමට පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය</u>

ත්‍රිකුණාමලය හා දඹුල්ල දිස්ත්‍රික්කයන්හි සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ස්ථාපිත තිරසර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක අදියර දෙකකින් සමන්විත ව්‍යාපෘතියකි.

මෙහි I වන අදියර එනම්, නාගරික ව්‍යාපෘති සැකසීමට පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය 2019 වසරේ දී ඇ.ඩො.මිලි. 5.7ක ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල්කින් සහ ඇ.ඩො.මිලි. 0.7ක දේශීය අරමුදලකින් ආරම්භ කරන ලදී. මෙමගින් 2 වන අදියර වන තිරසාර සංචාරක අංශයේ සංවර්ධන වැඩසටහන සඳහා යෝජිත උප ව්‍යාපෘති පැකේජ 6 ක් යටතේ වාස්තු විද්‍යාත්මක සැලසුම්, විස්තරාත්මක සැලසුම්, සමාජ හා පරිසර සංරක්ෂණ වාර්තා, වියදම් ඇස්තමේන්තු හා ප්‍රසම්පාදන ලේඛන සකසා ගැනීම සිදු කරන ලද අතර එහි භෞතික ප්‍රගතිය 80%කි. 2024 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට රු.මිලි. 320ක ප්‍රතිපාදන වෙන්වූ අතර සමස්ථ ව්‍යාපෘතියේ සමුච්ඡිත මූල්‍ය පිරිවැය රු.මිලි. 525.39කි. 2 වන අදියර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ඇ.ඩො. මිලි. 30ක ණය මුදල සඳහා මෙතෙක් ගිවිසුම් අත්සන් තබා නොමැත.

නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම යටතේ පහත සඳහන් පැකේජ දෙක සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, විස්තරාත්මක සැලසුම්, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා, වියදම් ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය ලියවිලි සකස් කර ප්‍රසම්පාදනය ආරම්භ කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබාගැනීම සඳහා යොමු කර ඇත.

පැකේජය 1: නවගම්මානය රථගාල, සියවස් මාවත, විදේශික සංචාරකයන්ගේ නැවතුම් අංගනය, කෞතුකාගාරය හා සීගිරිය වැව සංවර්ධනය කිරීම

පැකේජය 2: Heritage Trail (3,400mt) සංවර්ධනය කිරීම, මාපාගල පුරාවිද්‍යා රක්ෂිතය, පිදුරංගල පුරාවිද්‍යා රක්ෂිතය හා කලුදිය පොකුණ පුරාවිද්‍යා රක්ෂිතය වැඩිදියුණු කිරීම

පහත සඳහන් පැකේජ තුන සඳහා සංකල්පිය සැලැසුම්, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා සහ මූලික ඇස්තමේන්තු සකස් කර ඇත.

පැකේජය 3: ෆෝඩ් ෆෙඩරික් බලකොටුව ප්‍රතිසංස්කරනය කිරීම, කන්නියා උණුවතුර ළිං සංරක්ෂණය කිරීම හා පෞරාණික ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම

පැකේජය 4: ලන්දේසි බොක්ක සහ Back bay වෙරළ තීර සංවර්ධනය කිරීම

පැකේජය 5: ගලේවෙල වැව, ළමා උද්‍යානය සංවර්ධනය කිරීම හා අවන්හල ඉදිකිරීම

පැකේජය 6 සඳහා ශක්‍යතා වාර්තාව, සමාජ සහ පරිසර ආරක්ෂණ වාර්තා සහ මූලික සැලැස්ම සකස් කර ඇත.

පැකේජය 6: දඹුල්ල සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2.2.8. අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන යටතේ සංස්කෘතික හා ස්වභාව උරුමයන් රැකගනිමින් අනුරාධපුර නගරයේ පූජනීය ස්ථාන සංවර්ධනය වෙනුවෙන් වූ තුලිත ක්‍රමවේදයක් ප්‍රචලිත කිරීම සහ විදේශිකයන්ට ආකර්ෂණය වන නගරයක් බිහිකිරීමේ අරමුණින් ස්ථාපිත මෙම ව්‍යාපෘතිය ප්‍රංශ නියෝජිත ආයතනයේ විදේශ ණය මුදල් යූරෝ මිලි. 52.0 ක් සහ දේශීය අරමුදල් යූරෝ මිලි. 10.4 ක ණය පහසුකම් ඇතිව 2016.12.01 වන දින ආරම්භ කල අතර අනුරාධපුර මහා නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතියට අයත් විෂය පථය පහත පරිදි වේ.

- නාගරික සංරචක වැඩි දියුණු කිරීම - ප්‍රවේශය, සංචරණය හා රථවාහන කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- පොදු අවශ්‍යතා වැඩි දියුණු කිරීම - ආකර්ශනීය ලෙස පොදු අවශ්‍යතා ගුණාත්මකභාවයකින් යුතුව වැඩි දියුණු කිරීම.
- ගංවතුර අවදානම අවම කිරීම සඳහා නාගරික ජලාපවහන වැඩිදියුණු කිරීම.
- ජාතික උරුමය වැඩිදියුණු කිරීම.
- මූල්‍ය තිරසර කළමනාකරණය සඳහා යටිතල පහසුකම් හා වත්කම් හිමියන් සඳහා ධාරිතා ගොඩනැංවීම.
- මලාපවහන සහ අපජල කළමනාකරණ සැලැස්ම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.

නාගරික සංරචක වැඩි දියුණු කිරීම යටතේ, අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2024 වර්ෂය තුල රු.මිලි. 303.27ක් වැයකර ඇති අතර 46%ක භෞතික ප්‍රගතියක් ලභා කරගෙන ඇත. 2024 වර්ෂය අවසාන වනවිට අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මි. 2,751.30ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 54.91%කි.

2.2.9. <u>හිල්ටන් හෝටලය සංවර්ධනය</u>

කලාපයේ නැගී එන සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවරකින් සමන්විත හිල්ටන් හොටෙල් කළමනාකරණ හෝටලයේ හිමිකාරීත්වය දරණ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් රාජ්‍ය භාණ්ඩාගාරය විසින් 100%ක කොටස් අයිතිය හිමි රජය සතු ව්‍යවසායක් වේ.

2024 අවසන් වන විට අමුත්තන්ගේ කාමර 264ක් සාර්ථකව ප්‍රතිසංස්කරණය සිදුකර අවසන් කිරීම, ස්පෝර්ට් සෙන්ටර්හි ග්‍රෑන්ඩ් මා(ර්)කි (Grand Marquee) හඳුන්වා දීම, නව විවෘත සංකල්පයක් ලෙස ‘‘ලොටස් ලවන්’’ නමින් රැස්වීම් අවකාශයක් හඳුන්වා දීම සහ ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතික කිරීම් (ISO 22000: 2018 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති, HACCP) වැනි කාර්යයන් සාර්ථකව නිම කිරීමට හැකිවිය, එමෙන්ම වැඩ කිරීම සඳහා සුදුසුම ස්ථානය සම්මාන - 2023 සහ SLIM Kanter සම්මානය - 2023 යන සම්මාන ලැබීම 2024 වසරේ දී ලද විශේෂ ජයග්‍රහන වේ.

2.2.10 <u>කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණය</u>

අධ්‍යාපනය, තාක්ෂණය සහ විනෝදාස්වාදය යන ප්‍රධාන කරුණු මත දැනුම ප්‍රවර්ධනය කිරීම තාක්ෂණික දියුණුව සහ විවිධ විනෝදාස්වාදය සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස කොළඹ නෙළුම් කුළුණ ස්ථාපිත කිරීමේ අරමුණ පෙරදැරිව ස්ථාපනය කරන ලද කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගම 2024 වර්ෂයේ දී ආරම්භක ව්‍යාපාර කළඹ (නිරීක්ෂණ තට්ටුවේ ටිකට්පත්, වාණිජ අවකාශයන් සඳහා ඉඩ දීම, උත්සව කළමනාකරණය) යටතේ රු.මිලි. 966ක ආදායමක් ද සිහිවටන සාප්පුව යටතේ රු.මිලි. 50ක ආදායමක් ද ඩිජිටල් කලා කෞතුකාගාරය යටතේ රු.මිලි. 43ක ආදායමක් ද කැරකෙන අවන්හල සහ උත්සව ශාලාව යටතේ රු.මිලි. 722ක ආදායමක් ද ලභා කර ගැනීමට සමත්විය.

එමෙන්ම, 2024 වර්ෂයේ දී නැරඹුම් පීඨිකාව සඳහා දේශීය නරඹන්නන් 1,012,311 හා විදේශීය නරඹන්නන් 69,842 ද ඩිජිටල් කලාගාරය සඳහා නරඹන්නන් 161,095ක් ද පැමිණ ඇත. තවද, නෙළුම් කුළුණෙහි වාණිජ හා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ අරමුණින් යුතුව මැජෙස්ටික් ප්‍රයිඩ් කැසිනෝ ව්‍යාපෘතියේ බිම් මහලේ වර්ග අඩි 6,350 ක ප්‍රමාණයක්, විසි අටවන මහලේ වර්ග අඩි

10,610ක ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම, පළමු මහලේ වර්ග අඩි 6,743 ක ප්‍රමාණයක් ඔවුන්ගේ කාර්යාල කටයුතු සඳහා මාස හයකට කුලී පදනම මත ලබාදීම සහ දෙවන මහලේ වර්ග අඩි 45,260ක ව්‍යාපාර කටයුතු කිරීම සඳහා අවශ්‍ය නවීකරණ කටයුතු ආරම්භ කිරීම කරන ලදී.

2.3. නිවාස සංවර්ධනය

2.3.1 අඩු ආදායම්ලාබී නිවාස වැඩසටහන

2.3.1.1 . නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

නාගරික අඩු පහසුකම් ජනාවාස වල පදිංචිකරුවන් ස්ථීර නවීන නිවාස ඒකක සඳහා පුනස්ථාපනය කිරීම මගින් නගරයේ පවතින අඩු පහසුකම් සහිත නිවාස ඉවත් කිරීමේ අරමුණ හා ඔවුන් සාමාජීය හා ආර්ථික වශයෙන් ඉහළ නංවාලීමේ අරමුණ පෙරදැරි කරගෙන නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොළඹ නගරය කේන්ද්‍රකරගනිමින් ක්‍රියාවට නැංවන ලදී. 2010 වසරේ සිදු කරන ලද සමීක්ෂණයකට අනුව හඳුනාගත් කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී පවුල් 68,812ක් සඳහා නිවාස ඒකක 50,000ක් ඉදිකිරීම පාදක කොටගෙන මෙම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 15,768 ක් ඉදිකිරීම් අවසන් කොට නිවාසලාභීන් පදිංචි කරමින් පවතී.

ව්‍යාපෘතියට 2024 වර්ෂය සඳහා රු.මිලි. 7,000ක ප්‍රතිපාදන වෙන් කල අතර 2024 වසරේ වියදම රු.මිලි. 4,712.64කි. 601 වත්ත නිවාස ව්‍යාපෘතියෙහි (නිවාස ඒකක 450) සහ කොලොන්නාව නිවාස ව්‍යාපෘතියෙහි (නිවාස ඒකක 336) 2024 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. රන්දොර උරුමය ඔප්පු ලබා දීම වැඩසටහන මගින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මේවන විට මිහිඳුසෙන්පුර, මෙට්‍රෝ හෝම්ස් හා සිරිසර උයන යන ව්‍යාපෘති 3 ක් සඳහා ඔප්පු 167ක් ලබා දී ඇත. ඉතිරි ප්‍රතිලාභීන්ට ඔවුන් වෙත නියමිතව ඇති අවශ්‍යතාවයන් සැපිරීම අනුව ඉදිරියේදී ඔප්පු නිකුත් කිරීම සිදු කෙරේ. අනෙකුත් ව්‍යාපෘති සඳහා ඔප්පු ලබාදීමට අවශ්‍ය අනුමැතීන් මේ වන විට ලබාගනිමින් පවතී.

කොන්ත්‍රාත්තරුවන්ගේ දුර්වලතා මත ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට සිදු වූ අතර, ඔවුනට අදාල නීතිමය කටයුතු සිදුකිරීම් මත ඉදිකිරීම් අඩාල වීම, ව්‍යාපෘති සඳහා රජයේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම් අවම වීම වැනි කරුණු මත නැවත ටෙන්ඩර් කැඳවීම් ප්‍රමාදයට ලක් වී ඇත. 2025 දී කොළඹගේ මාවතෙහි නිවාස ඒකක 615කින් සහ ටොරින්ටන් ඇවනියු නිවාස ඒකක 115කින් සමන්විත නිවාස ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, නව කොන්ත්‍රාත් ප්‍රදානය 2025 දී සිදු කිරීමට නියමිතය.

2.3.1.2. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතිය

අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ නිවාස තත්ත්වය වැඩි දියුණු කිරීම, දැරිය හැකි නිවාස ඉදිකිරීම සහ ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා ආයෝජනය කිරීම තුළින් කොළඹ ඉඩම් පරිහරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් 2019 වසරේ සිට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අරමුදල් පහසුකම යටතේ ස්ථාපිත මෙම ව්‍යාපෘතිය ඇ.ඩො. මිලි. 158ක් ආයෝජනයකින් සමන්විතය.

මෙම ව්‍යපෘතිය යටතේ කොළඹගේ මාවත නිවාස ඒකක 624ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන්ව අවසාන පවරා ගැනීමේ පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී (භෞතික ප්‍රගතිය 96%). ස්ටෙඩියම්ගම නිවාස ඒකක 1000ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය භාර ගැනීමේ

ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර නිවාස ඒකක 700ක ත්‍රෛපාර්ශවීය පරීක්ෂාව අවසන් කර ඇත (භෞතික ප්‍රගතිය 98%). ඇපල්වත්ත නිවාස ඒකක 700ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 40%කි. මාදම්පිටිය නිවාස ඒකක 700ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 44%කි. ෆග්ගූසන් පාර නිවාස ඒකක 750ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ගොඩනැගිලි තුනෙහිම ටැම් කුළුණු කටයුතු අවසන් කර ඇති අතර භෞතික ප්‍රගතිය 13%කි. 2024 වර්ෂය අවසාන වනවිට කොළඹ නාගරික පුනර් ජීවන ව්‍යාපෘතියට සහායවීමේ ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මී. 25,328.42ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 50.29%කි. 2024 වර්ෂය තුල රු. මිලි. 6,213.57ක් වැය කර ඇත.

2.3.1.3. චීන රජයේ ආධාරමත අඩුආදායම්ලාභී පුද්ගලයන් සඳහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය

කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන ජනතාව සඳහා පහසුකම් සහිත නිවාස ලබාදීමේ අරමුණ සහිතව මහජන චීන සමූහාණ්ඩුව ශ්‍රී ලංකාවේ නිවාස ඒකක 1,996 ක් ඉදිකිරීමට ආධාර කිරීම සඳහා රෙන්මින්බි මිලි. 552 ක ප්‍රදානයක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී කාණ්ඩයට ප්‍රතිලාභ සැලසීමේ අරමුණින් පැලියගොඩ නිවාස යෝජනා ක්‍රමය (නිවාස ඒකක 615ක්), දෙමටගොඩ නිවාස යෝජනා ක්‍රමය (නිවාස ඒකක 586ක්), මොරටුව නිවාස යෝජනා ක්‍රමය (නිවාස ඒකක 575ක්) සහ මහරගම නිවාස යෝජනා ක්‍රමය (නිවාස ඒකක 112ක්) ඇතුලුව මුළු සහනාධාර නිවාස ඒකක 1,888 ක් සහ ප්‍රවීණ කලාකරුවන් සඳහා නම් කරන ලද කොට්ටාව නිවාස යෝජනා ක්‍රමය (නිවාස ඒකක 108) ඉදිකිරීමට යෝජිතය.

චීන රජයේ නියෝජිතායතනය සමග අත්සන් කරන ලද ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ගිවිසුම සඳහා 2023.11.27 දින අත්සන් කරන ලදී. ඊට 2024.05.16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. නිවාස ඉදිකිරීමට අදාලව පැකේජ 3ක් යටතේ කොන්ත්‍රාත් පිලිගන්වා ඇති අතර, 2024.12.27 දින නිල වශයෙන් මුල්ගල් තබා ආරම්භ කරන ලදී. 2024 වර්ෂයේ ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 7.5%ක් වන අතර 2024 වර්ෂය තුල යුවාන් මිලි. 69.95ක් සහ රු.මිලි. 156.67ක් වැය කර ඇත. ව්‍යාපෘතියේ සමුච්ඡිත මූල්‍ය ප්‍රගතිය රු. මිලි. 397.67කි.

2.3.1.4. "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහන

"ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස වැඩසටහන මගින් අඩු ආදායම්ලාභීන් සඳහා රු.650,000/- ක උපරිමයකට යටත්ව ඉදිකිරීම් ප්‍රගතිය මත පදනම්ව අදියර වශයෙන් ආධාර ලබා දීම සිදු කෙරේ. මේ යටතේ 2024 වර්ෂය තුල නිවාස 2,877 ක ඉදිකිරීම් අවසන් කර ඇත.

2.3.1.5. "මිහිදුපුර" නිවාස ව්‍යාපෘතිය

කොළඹ 05, එඩිමන්ටන් පාර පිහිටි, 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද මිහිදුපුර නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩමක ආරම්භ කර ඇති මහල් 24 කින් සමන්විත ස්ථම්භ 02කින් යුත් නිවාස ඒකක 560ක ව්‍යාපෘතියකි. අඩු ප්‍රගතියක් පැවතීම හේතුවෙන් 2017 වසරේ අවසන් කර ඇත. එහි කාර්යයන් සිදු කරන ලද CDC Industrial Infras ආයතනය විසින් සිදුකරන ලද ඉල්ලීමක් සලකා බලා මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කරයි.

- ව්‍යාපෘතියේ පෙර පැවති වර්ග අඩි ප්‍රමාණය වැඩිවීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු ක්‍රියාත්මක කරයි.
- අලවිකරණය, නිර්මාණකරණය අවසන් වන තුරු හා එස්ක්‍රෝ ගිණුම ආරම්භ කරන තුරු ඉදිකිරීම් මන්දගාමීව සිදුවේ.

2.3.1.6. "හන්තාන" නිවාස ව්‍යාපෘතිය

හන්තාන අදියර II සඳහා ප්‍රදේශයේ ජනතාවගේ උද්ඝෝෂණ හා පරිසර සංවිධාන විසින් ගොනු කළ නඩු කටයුතු හමුවේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම ප්‍රමාද විය. පරිසර සංවිධාන මඟින් පවරා තිබූ නඩු කටයුතු අවසන් වී ඇත. අදියර II හි නිවාස 82 න් 8ක වැඩ ආරම්භ කර ඇත. අතිරේක ගිවිසුම් අත්සන් කර ඇති අතර ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිතය. අදියර III හි නිවාස 20කි. එම නිවාස තවමත් විකිණීං නොමැති බැවින් ඉදිකිරීම් ආරම්භ කර නොමැත.

2.3.1.7. "සොයිසාපුර" පුනස්ථාපන නිවාස ව්‍යාපෘතියේ අදියර III යටතේ කලාප II හා IIIට අයත් නව ගොඩනැගිලි දෙක ඉදිකිරීම

නිවාස ඒකක 30කින් යුත් ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් මේ වනවිට අවසන් කර ඇත. නිවාස ඒකක 20ක් විකුණා ඇති අතර තවත් නිවාස ඒකක 10ක් විකිණීමට ඇත.

2.3.1.8. අනුරාධපුර, මහවිලච්චිය, පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ඉදිකිරීම (නිවාස ඒකක 115)

2017 වසරේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලි. 450.5කි. 2024 වසරේ වියදම රු.මිලි. 97.73වන අතර ව්‍යාපෘතියේ සමුච්ඡිත වියදම රු.මිලි. 256.37කි. ව්‍යාපෘතියේ සමුච්ඡිත භෞතික ප්‍රගතිය 30%ක් වන අතර ඉදිකිරීමට අපේක්ෂිත නිවාස 115වෙන් 56ක ඉදිකිරීම් නිමකර ඇත. ඉන්දියානු ආධාර යටතේ කල යුතු ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් මිල ගණන් වැඩි වීම හේතුවෙන් විෂය පථය වෙනස් වීම ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට යොමු කර 2024.04.09 දින අනුමැතිය ලබා ගෙන ඇත.

2.3.2. මධ්‍යම ආදායම්ලාභී නිවාස සංවර්ධනය

2.3.2.1. මධ්‍යම ආදායම්ලාභී නිවාස වැඩසටහන- නාගරික සංවර්ධන අධිකාරිය

ව්‍යාපෘති කිහිපයක්ම රජයේ අයවැය යෝජනාවන්ට අනුගත වෙමින් දැරියහැකි මිලට නිවාස ව්‍යාපෘති ලෙස ආරම්භ කලද, (නිවාස ඒකක 2,483) පසුගිය සමයේ ඇති වූ දැඩි ආර්ථික අර්බුදය හමුවේ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහලයාම හේතුවෙන් හා අලෙවිකරණ ගැටළු හේතුවෙන් මෙන්ම, අඩුපොලී බැංකු ණය සහන යෝජනා ක්‍රමය රාජ්‍ය බැංකු මඟින් නතර කිරීම නිසා ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට හේතු විය. මේ වන විට එම ව්‍යාපෘති නැවත මධ්‍යම ආදායම් ව්‍යාපෘති ලෙස පරිවර්තනය කොට නිවාස අලෙවියෙන් ලැබෙන ආදායම් මගින් ඉදිකිරීම් ඉදිරියට කරගෙන යාමට පියවර ගනිමින් ඇති අතර, රාජ්‍ය හා පෞද්ගලික මැදිහත්වීමේ ක්‍රමවේදයන් යටතේ ඇතැම් ව්‍යාපෘති ආරම්භ කිරීමට අධ්‍යයනය කරමින් පවතී.

2.3.2.2. මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති - නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මධ්‍යම ආදායම්ලාභී නිවාස වැඩසටහන යටතේ වත්තල, වැලිසර නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 408), නිට්ටඹුව, ඔර්වර්ඩ්වත්ත නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 130), ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 168), හික්කඩුව, තුඩුවේගොඩ නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 200), කඩුවෙල මිශ්‍ර සංවර්ධන නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 108) සහ අතුරුගිරිය නිවාස ව්‍යාපෘතිය (නිවාස ඒකක 112) සඳහා මූලික අනුමැතීන්/ නිශ්කාෂන ලබා ගැනීම හා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවති.

2.3.2.3. මධ්‍යම ආදායම්ලාභී නිවාස වැඩසටහන - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නිවාස ඒකක 196 කින් සමන්විත වාද්දුව සී බ්‍රීස් නිවාස ව්‍යාපෘතිය 2016.06.27 දින ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර නිවාස ඒකක 124 කින් සමන්විත රාගම ලාවන්‍යා හයිට්ස් නිවාස ව්‍යාපෘතිය 2016.11.05 දින ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

මෙම නිවාස ව්‍යාපෘති දෙකෙහිම සංවර්ධනකරු ලෙස කටයුතු කරන ලද්දේ CML-MTD Construction සමාගමයි. මෙම ව්‍යාපෘති 02 හි ඉදිකිරීම් පිළිවෙලින් 2018.06.26 හා 2018.11.04 දින වන විට අවසන් කිරීමට නියමිත විය. එහෙත් සංවර්ධනකරු විසින් මුහුණ පෑ මූල්‍යමය ගැටලු හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාද විය.

මේ වන විට සංවර්ධනකරු බුන්වත් වී තිබීම හේතුවෙන් අධිකරණමය ක්‍රියාමාර්ගයක් තුළින් ඇවරකරු තෝරාගෙන ඒ හරහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘති 02 හි කටයුතු නැවත ආරම්භ කර ඇත. ව්‍යාපෘති 02 හි ඇස්තමේන්තු සංශෝධනය කර ඇති අතර ප්‍රතිලාභීන්ගේ එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිතය.

2.3.3. නාගරික ජනාවාස සමාජ සංවර්ධනය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ජනතා අයිතියට පත්කරන ලද නිවාස ව්‍යාපෘතින්හි හිමිකම් ඔප්පු 16ක් 2024 වසරේ දී ප්‍රතිලාභීන් හට ප්‍රදානය කරන ලදී. සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන පාරිසරික වැඩසටහන මගින් ජනාවාස 17ක දරුදැරියන් 1,000 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රුක් රෝපණ සහ ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් ප්‍රජා සමිති හා ළමා සමිති සම්බන්ධ කරගනිමින් සිදුකරන ලදී. එසේම, 38 වන ලෝක ජනාවාස දිනය මෙවරත් "තුරුණු ජවයෙන් සපිරි නගරයක්" යන තේමාව යටතේ පවත්වන ලදී.

2.3.4. සහාධිපත්‍ය ජනාවාස කළමනාකරණය

සහාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පාර්ශවකරුවන් ප්‍රමාණවත් පරිදි සපයා ඇති බවට සහතික කිරීම හා පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම, පාලනය හා පරිපාලනය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවීම, අධිකාරියේ ලියාපදිංචි කිරීම සහ සක්‍රීයව ක්‍රියාත්මක කරවීමේ කටයුතු ඉටුකිරීම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය කාර්යභාරයයි.

ඒ අනුව, 2024 වර්ෂයේ දී තාවකාලික සහාධිපත්‍ය සහතික 04ක්, අර්ධ සහාධිපත්‍ය සහතික 01ක්, අවසන් සහාධිපත්‍ය සහතික 44ක්, සහ මූලික සැලසුම් නිෂ්කාශන (25%) සහතික 49ක්, අලුත් කිරීමේ ගාස්තු සහතික 14ක් නිකුත් කර ඇත. තවද, කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීම යටතේ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු 05ක් (නිවාස ඒකක 168ක් සඳහා) සහ පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු 39ක් (නිවාස ඒකක 1,833ක් සඳහා) ලියාපදිංචි කර ඇත. ඒමෙන්ම, කළමනාකරණ සංස්ථා/ කළමනාකරණ කමිටු අලුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යටතේ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා/කළමනාකරණ කමිටු 80ක් (නිවාස ඒකක 3,180ක් සඳහා) සහ පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා/කළමනාකරණ කමිටු 444ක් (නිවාස ඒකක 18,116ක් සඳහා) අලුත් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

2024.12.31 දිනට රු.මි. 281.55 ක වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව රු. මිලි. 272.035 ක මුදලක් එකතු කරගැනීමට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හැකි වූ අතර එය ඉලක්කගත

ප්‍රගතියෙන් 97% ක කාර්යසාධනයකි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය සඳහා ශුද්ධ ලාභ ආන්තිකය 41%ක් සහ මෙහෙයුම් වියදම් 68%ක් ලෙස වාර්තා විය. සභාධිපත්‍ය දේපල වල පොදු අංගෝපාංග හා පොදු උපාංග සම්බන්ධයෙන් අධිකාරිය වෙත 2024 වසරේදී පැමිණිලි 2,612 ක් ලැබී ඇති අතර 2024 දෙසැම්බර් 31 දිනට ඉන් 2,423 ක් සම්පූර්ණයෙන්ම විසඳන ලදී. මහල් නිවාස අයිතිය පිළිබඳ පනත සහ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනත සඳහා යෝජිත සංශෝධන අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සහ සකස් කිරීම සිදුකෙරෙමින් පවතී.

අභියෝග

- සභාධිපත්‍ය දේපළ කර්මාන්තය රටේ නිවාස අවශ්‍යතාවය කෙරෙහි නිසි ලෙස ඉලක්කගත නොවීම.
- අධිකාරියේ අරමුණු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විවිධ අරමුණු සඳහා පිහිටුවන ලද ආයතන විශාල ගණනක් සමඟ කටයුතු කිරීමට සිදු වීම.
- පෞද්ගලික අංශය මගින් ඉදි කරනු ලැබූ සභාධිපත්‍ය දේපළ ගැනුම්කරුවන්ගේ මිල දී ගැනීමේ ප්‍රවණතාවය අඩු වීම.
- සභාධිපත්‍ය දේපළ නඩත්තුව සඳහා ප්‍රජා සහාය අතිශය අවම මට්ටමක පැවතීම.
- ඉදිකිරීම් පිරිවැය අධිකවීම හේතුවෙන් මධ්‍යම ආදායම් ලාභීන්ට සහ අඩු ආදායම් ලාභීන්ට එම නිවාස මිල දී ගැනීට ඇති අපහසුතාවය.
- සභාධිපත්‍ය දේපළ නඩත්තු හා සේවා සපයන්නන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු.

ඉදිරි ඉලක්ක

- සභාධිපත්‍ය දේපල වල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග වලට අදාලව Clean Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තුව, පාලනය, පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට මග පෙන්වීම සහ නියාමනය.
- ඉදිකරමින් පවතින සභාධිපත්‍ය දේපළවල ප්‍රගතිය නියාමනය.
- නැවත සංවර්ධනය කළ යුතු දේපළ හඳුනාගැනීම සහ ඊට අදාල ප්‍රතිසංවර්ධන සැළසුම් රජයට ඉදිරිපත් කිරීම.
- හඳුනාගත් සභාධිපත්‍ය දේපළ ප්‍රතිසංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ලබා ගැනීම හා එම දේපළවල අදාළ කාර්යයන් පෙළගැස්වීමට අදාළව යම් ප්‍රතිශතමය මුදලක් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලබා ගැනීම.
- සභාධිපත්‍ය ගැටළුවලට කාලෝචිත විසඳුම් ලබාදීම හා සභාධිපත්‍ය දේපළ නීතිය හා රෙගුලාසි යාවත්කාලීන කිරීම.
- සභාධිපත්‍ය දේපල හා එහි නීතිය සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

2.3.5. <u>නිවාස දේපල කළමනාකරණය</u>

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශයේ පවත්වාගෙන යනු ලබන ජාතික නිවාස කොමසාරිස් අංශය 1973 අංක 1 දරණ නිවාස දේපල උපරීමය පිළිබඳ නීතිය යටතේ පැවරී ඇති බලතල හා වගකීම් පරිදි පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

- 1973 අංක 1 දරණ නිවාස දේපල උපරීමය පිළිබඳ නීතිය යටතේ ජාතික නිවාස කොමසාරිස් වෙත පැවරුණු දේපලෙහි කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබාදීම.

- ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් පවරාගනු ලැබූ නිවාසවල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.

ඒ අනුව 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ කාර්යාලයට පැමිණි මහජනතාවගේ ගැටළු සහ ලිඛිතව ඉදිරිපත් වූ ගැටළු සඳහා විසඳුම් ලබා දීම සිදු කරන ලද අතර, 1973 අංක 1 දරණ නිවාස දේපල උපරීමය පිළිබඳ නීතිය යටතේ සින්නක්කර ඔප්පු 43ක් නිකුත්කර ඇත. එසේම පිඹුරු පිටපත් 64 ක් නිකුත්කර ඇත. නිවාස දේපල සම්බන්ධව මහජනතාවට පැන නැගුණු ගැටළු සම්බන්ධයෙන් ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් පවත්වන ලද අර්ධ අධිකරණමය පරීක්ෂණ සංඛ්‍යාව 21කි. නිවාස දේපලවල පැන නැගුණු ගැටළු සම්බන්ධයෙන් ඒවයේ සත්‍ය ස්වභාවය හඳුනාගැනීමට ස්ථානීය පරීක්ෂණ 17ක් පවත්වා ඇත. තවද නඩු කටයුතු වෙනුවෙන් විවිධ අධිකරණ ඉදිරියේ සාක්ෂි පිණිස පෙනී සිටීමද , අධිකරණ කටයුතු සඳහා ලේඛන සකස් කිරීම ද, නීතිපති වරයා සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාල කටයුතු ඉටුකිරීම ද සිදුකර ඇත.

2025 ඉදිරි දැක්ම

- ජාතික නිවාස කොමසාරිස්වරයාට පැවරී ඇති එහෙත් 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට අනුව තව දුරටත් ඔප්පු ලබා දීමට නොහැකි වූ කුලී නිවැසියන් ට ඔප්පු ලබා දිමට හැකිවන පරිදි සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සමග එක්ව සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කිරිම.
- ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත පැවරී ඇති මෙතෙක් හඳුනා නොගත් නිවාස දේපල හඳුනා ගැනිමට කටයුතු කිරිම සහ අදාල තොරතුරු ලේඛන ගත කර විශ්ලේෂණය කිරිම.
- ස්ථානීය පරීක්ෂණ සහ කාර්යාලීය පරීක්ෂණ පවත්වා නිවාස වල පදිංචි කරුවන්ගේ/කුලී නිවැසියන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීම.

2.4. අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම

අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීමට අදාළව 2009 සිට 2024 දෙසැම්බර් 31 කාලය තුල උතුරු පළාතේ පවුල් 184,874 කට අයත් පුද්ගලයන් 580,203 ක්ද නැගෙනහිර පළාතේ පවුල් 91,392 කට අයත් පුද්ගලයන් 338,537 ක්ද වශයෙන් මුළු පවුල් 276,266 කට අයත් පුද්ගලයන් 918,740 නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට හැකිව ඇත.

ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් හානියට පත් නිවාස වෙනුවට නව නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය හා නැවත පදිංචි කල ප්‍රදේශ වලට අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතින්ද උතුරු හා නැගෙනහිර පළාත් වල බිම්බෝම්බ ඉවත් කිරීමේ ව්‍යාපෘතියද දැනට මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ.

- **අවතැන්වූ පවුල් සඳහා ගඩොල් සහ බදාම ආකාරයේ ස්ථිර නිවාස ලබාදීමේ වැඩසටහන**

  මෙම නිවාස ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් විසින්ම ඉදිකරනු ලබන පදනම මත ක්‍රියාත්මක වේ. ඒ අනුව 2024 වර්ෂයේදී උතුරු හා නැගෙනහිර පළාත් වල දිස්ත්‍රික්ක 08 හි නව නිවාස 1,498 ක් ඉදිකිරීම් ආරම්භ කළ අතර එයින් නිවාස 1,302 ක ඉදිකිරීම් අවසන් කර ඇත. තවද පසුගිය වර්ෂ වලදි අවිච්ඡේද වූ නිවාස 483 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මේ අනුව නිවාස 1,785 ක ඉදිකිරීම් අවසන් කර ඇත

- **නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

  2024 වසරේ මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 3,586 කට පානීය ජල පහසුකම් ලබා දුන් අතර පවුල් 2,404 කට ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබා දෙන ලදී. යාපනය දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කල ප්‍රදේශවල අභ්‍යන්තර මාර්ග 07ක ඉදිකිරීම් අවසන් කර ඇත.

  නැවත පදිංචි කරන ලද පවුල්වල වෙසෙන වකුගඩු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන ප්‍රදේශයන්හි පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට පවතින දුෂ්කරතා සැළකිල්ලට ගෙන NANO/RO තාක්ෂණයෙන් යුත් පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2021 වසර තුළ ආරම්භ කරන ලද අතර 2024 වර්ෂයේදී උතුරු හා නැගෙනහිර පළාත්හි මෙම ඒකක 50 ක ඉදිකිරීම් අවසන් කර ජනතා අයිතියට පත්කරන ලදී.

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

#	ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන 2024 (රු.මි.)	වියදම් ප්‍රමාණය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය 2024.12.31 (%)
01	උතුරු හා නැගෙනහිර පළාත් වල අවතැන් වූ පවුල් සඳහා ගඩොල් හා බදාම අකාරයේ ස්ථිර නිවාස ලබාදීමේ වැඩසටහන	2000.00	1,798.17	89.90%
02	නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	500.00	283.27	56.65%
03	බිම් වෙඩි ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය	60.96	57.57	94.43%

ජයග්‍රහණ

2024 වර්ෂය තුල යාපනය දිස්ත්‍රික්කයේ තවදුරටත් නිදහස් කිරීමට ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 303.40 ප්‍රමාණයක් නිදහස් කිරීමට හැකි විය. මෙම ඉඩම් අතරින් තෙලිප්පලෙයි ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයට අයත් පලාලි අධි ආරක්ෂිත කලාපයේ පිහිටි ඉඩම් ද ඇතුළුව අක්කර 302.92 ප්‍රමාණයක් නිදහස් කිරීමට හැකි විය.

2025 ඉදිරි දැක්ම

උතුරු හා නැගෙනහිර පළාත්වල අවතැන්වූ පවුල් සඳහා ගඩොල් හා බදාම ආකාරයේ ස්ථිර නිවාස ලබාදීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේදී නිවාස 2,179 ඉදි කිරීමට අපේක්ෂිතය. මෙයට අමතරව නැවත පදිංචි කල ජනතාවගේ පානීය ජල අවශ්‍යතා හා ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබාදීමටද, නැවත පදිංචි කල පවුල් වාසය කරන ප්‍රදේශ වල අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ඉදිකිරීමටද 2025 වර්ෂයේ දී අපේක්ෂා කෙරේ. මෙයට අමතරව මෑත කාලවලදී නිදහස් කල ඉඩම්වල පදිංචි වීමට අපේක්ෂා කරන පවුල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමට ද අපේක්ෂිතය.

2.5. තිරසර පරිසරයක් නිර්මාණය කිරීම

2.5.1 නාගරික වැසි ජල කළමනාකරණය

ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වැසි ජල අපවහන, තෙත්බිම් කළමණාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉංජිනේරු සේවා සැපයීමේ මෙහෙවර ඉටුකරමින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම දිගුකාලීන තිරසාර භාවය සඳහා වැසි ජල අවම කිරීමේ ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, තෙත්බිම් සහ පහත්බිම් සංවර්ධනය, නිර්මාණ කටයුතු, සිතියම්කරණය සහ ශක්‍යතා අධ්‍යනය වැනි කාර්යයන් සිදු කරනු ලබයි.

2.5.2 ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම

ඇළ මාර්ග ජාලය, වැව්, ඇවිදීමේ මංතීරු සහ රථගාල් නඩත්තු කිරීම, ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම, තෙත්බිම් සහ පහත් බිම් සංවර්ධනය, සවිස්තර සැලසුම් සකස් කිරීම, සිතියම්ගත කිරීම සහ ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කිරීම මේ යටතේ සිදු කරනු ලබයි. 2024 වර්ෂය තුළ මෙම වාර්ෂික නඩත්තු කටයුතු සඳහා රු.මිලි. 1,566.32ක ප්‍රතිපාදන වෙන් කල අතර රු.මිලි. 1,565.96ක වැය කර ඇත.

2.5.3 ඔලියමුල්ල වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2018 වර්ෂයේ දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 3,000.00 වන මෙම ව්‍යාපෘතිය යටතේ පොම්පාගාර අදියර I සහ II ඉදිකිරීම, ඇළ මාර්ග වැඩිදියුණු කිරීම, පැලියගොඩ - පුත්තලම මාර්ගයේ අංක 3/1 පාලම සහ බෝක්කු ඉදිකිරීම සහ ඉවුරු පිහිටුවීම සිදුකෙරේ. 2024 වර්ෂය අවසාන වනවිට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මි. 2,830.31ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 90%කි.

මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියෙන් 97% ක ප්‍රගතියක් ලබා ඇත. පැලියගොඩ - පුත්තලම මාර්ගයේ අංක 3/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කර මහජනතාවට විවෘත කර ඇත. ඉවුරු පිහිටුවීම දැනටමත් අවසන් කර ඇත. පොම්පාගාරය II හි සිවිල් ව්‍යුහය ඉදිකිරීමෙන් 98% කට වඩා අවසන් කර ඇත. ගේට්ටු, stop logs නිෂ්පාදනය, කසළ පිරික්සුම් යන්ත්‍ර සවි කිරීම, ගේට්ටු එසවීමේ පද්ධතිය සැකසීම, පොම්ප සහ එන්ජින් සවි කිරීම නිම කර ඇත. පොම්පාගාර අදියර I ක්‍රියාත්මක කර නොමැති අතර එය වත්මන් වැඩ විෂය පථයෙන් ඉවත් කර ඇත.

2.5.4. කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

දේශීය අරමුදල් යටතේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 8,300.00ක් සහිතව 2018 වසරේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ කොළොන්නාව ප්‍රදේශයේ ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම, ද්විතියික ඇළ මාර්ග, දහම්වෙල, පස්සන්න, සැලලිහිණි මාවත සහ දන්දුතොට ඇළ මාර්ගවල ජල විද්‍යාත්මක, භූ තාක්ෂණික, ව්‍යුහාත්මක යනාදියට අදාළ ඉංජිනේරු සැලසුම් සකස් කිරීම, ටෙන්ඩර් ඇඳීම්, පිරිවිතර, පිරිවැය ඇස්තමේන්තු, ප්‍රමාණ බිල්පත් සහ ලංසු ලේඛන සකස් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, සමාජීය සහ පාරිසරික පරීක්ෂාව, දන්දුතොට ඇළ මාර්ග සමීක්ෂණ කටයුතු, තුප්පාවෙල වැවේ කැණීම් කටයුතු, කොරටුව පාරේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම, සැලලිහිණි මාවතේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම සිදුකරනු ලැබේ.

2024 වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 1,135.11ක් වන අතර සමුච්චිත භෞතික ප්‍රගතිය 14.17%කි. දහම්වෙල, පස්සන්න, සැලලිහිණි මාවත සහ දන්දුතොට ඇළ මාර්ගවල ඉංජිනේරු ජල විද්‍යා සහ ජල විද්‍යා සැලසුම් කටයුතු සිදුකෙරෙමින් පවතී. ඉදිකිරීම් කටයුතු යටතේ තුප්පාවෙල වැව සෑදීමේ ප්‍රගතිය 86.3%ක් ද, කොරටුව පාරේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ ප්‍රගතිය 100%ක්ද, සැලලිහිණි මාවතේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීමේ ප්‍රගතිය 100%ක්ද වේ. නඩත්තු කටයුතු යටතේ කොලොන්නාව ප්‍රදේශයේ ඇළ මාර්ග ජාලය නඩත්තු කිරීම සිදුකෙරෙමින් පවතී.

2.5.5. ඛේරේ වැවේ රොන්මඩ ඉවත් කර පිරිසිදු කිරීම

ඛේරේ වැව වාරිෂික නඩත්තු කටයුතු, නිරිතදිග ඛේරේ වැවේ පාවෙන තෙත්බිම් ස්ථාපිත කිරීම, අඛණ්ඩ ජල තත්ත්ව අධීක්ෂණය, ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා තිරසාර දිගුකාලීන විසඳුම් සොයා ගැනීම, පෛව ප්‍රතිකර්ම මගින් ජල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම ආදී ක්‍රියාකාරකම්වලින් සමන්විත මෙම වැඩසටහනේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මිලි. 62.20කි. නිරිතදිග ඛේරේ වැවේ නව පාවෙන තෙත්බිම් 170ක් ස්ථාපිත කිරීම, පාවෙන තෙත්බිම් සඳහා නව පැල 900ක් නඩත්තු කිරීම සහ ස්ථානගත කිරීම, පෛව ප්‍රතිසංස්කරණය මගින් ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම 2024 වර්ෂය තුල සිදුකර ඇත.

2.5.6 වේරස් ගහ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2013 වසරේ දේශීය අරමුදල් යටතේ ඉදිකිරීම් ආරම්භ කර 2022 වසරේ ඉදිකිරීම් අවසන් වූ මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලි. 11, 050කි. පැරණි කැස්බෑව මාර්ගය ඔස්සේ පාලම්, බෝක්කු සහ ඇළ මාර්ග නිම කිරීම, මානෙල් මාවත, සූරියමල් මාවත, රබර් වත්ත සහ වෙල පාර වැව් නිම කිරීම, මානෙල් මාවත සහ වෙල පාර පාලම් නිම කිරීම, පැපිලියාන සහ අවට ප්‍රදේශවල ඇළ මාර්ග, බෝක්කු වැඩිදියුණු කිරීම, කරදියාන පාලම, ඇළ මාර්ග නඩත්තු මාර්ගය සහ ඇවිදීමේ මාර්ග ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී. 2021/2022 දී නිම කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ගෙවීම් හිමිකම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා 2024 වර්ෂය තුළදී රු.මිලි. 800.00ක ගෙවීම් කරන ලදී.

2.5.7. සේවාදායක අරමුදල් සහිත ව්‍යාපෘති

සේවාදායක අරමුදල් සහිත ව්‍යාපෘති යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති තිස්සමහාරාමය ප්‍රදේශයේ බබාවා හා තබරව වැව් ප්‍රතිසංස්කරණය කිරීම, නාගරික සංවර්ධන අධිකාරියට අයත් මොරටුව බැටරිවත්ත ප්‍රදේශයේ වැසි ජල අපවහන කළමනාකරණ ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය තුළ ඇති වගුරු බිම් ප්‍රදේශයේ ඇවිදීමේ මාර්ගය ඉදිකිරීම යන ව්‍යාපෘති සිදු කරන ලදී.

2.5.8. ස්වකීය අරමුදල් සහිත ව්‍යාපෘති

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව ස්වකීය අරමුදල් සහිත ව්‍යාපෘති ලෙස දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අක්වෙරළ වැලි අලෙවි කිරීම සහ කෙරවලපිටියෙහි අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සිදු කරන ලදී.

ශ්‍රී ලංකා ටෙක්නෝ ප්‍රදර්ශනයේ හොඳම ප්‍රදර්ශන කුටිය සඳහා රිදී සම්මානය ලබා ගැනීම සහ CNCI ACHIEVERS 2024 වෙතින් කුසලතා සම්මානය ලබා ගැනීම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් වැසි ජල අපවහන, තේත් බිම් කළමණාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබාගන්නා ලද විශේෂ ජයග්‍රහණ ලෙස හඳුන්වා දිය හැකිය.

2.5.9. කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

මහ කොළඹ කලාපයට සහ අනෙකුත් විභව පළාත් පාලන ආයතන සඳහා ආර්ථික ශක්‍යතාව සහිත, සමාජීය වශයෙන් පිළිගත හැකි, පරිසර හිතකාමී සහ දිගුකාලීනව තිරසාර සහ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැකසීමේ අරමුණින් 2017 වසරේ පුත්තලම අරුවක්කාලු ප්‍රදේශය ආශ්‍රිත ව්‍යුහයක් සහිත සනීපාරක්ෂක කසල රඳවනයක් ඉදිකරන ලදී. මෙම සංශෝධිත මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 33,237.76 කි.

මේ යටතේ, කැලණිය සහ අරුවක්කාලු කසල හුවමාරු මධ්‍යස්ථානය ඉදිකිරීම, අරුවක්කාලු සනීපාරක්ෂක කසල රඳවනය ඉදිකිරීම සහ දුම්රිය මාර්ග දිගුව සහ සම්බන්ධතා මාර්ග ඉදිකිරීමෙහි සැලසුම් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් හා සවුත්වේස්ට් මුනිසිපල් ඉංජිනියරින් ඇන්ඩ් රිසර්ච් ඉන්ස්ටිටියුඩ් ඔෆ් චයිනා වෙත 2017.12.29 දින ඇ.ඩො. මිලි. 90.482 සහ ශ්‍රී ලංකා මුදලින් රු. මිලි. 1,622.936 (බදු හැර) මුදලකට ප්‍රදානය කරන ලදී. දුම්රිය උපකරණ, යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් වැඩිදියුණු කිරීම් මිලදී ගැනීමට අදාලව බහාලුම් පෙට්ටි 94 ක්, දුම්රිය එන්ජින් 4 ක් සහ දුම්රිය ප්‍රවාහන ගැල් 34 ක් මිල දී ගැනීම ඇතුලත් වේ.

2024 වසරේදී රු.මිලි. 1,895.61ක් ද ඇතුලුව මේ වන විට මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීමේ කටයුතු සඳහා රු.මිලි.25,911.78 වැය කර ඇති අතර එහි සමුච්ඡිත භෞතික ප්‍රගතිය 98.7% වේ. කැලණිය කසල හුවමාරු මධ්‍යස්ථානයේ ස්ථාවර කම්පැක්ටර් සවිකිරීම හැර ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සියල්ල නිම කිරීම සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අදාළ ආයෝජකයකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර සකස් කිරීම 2024 වසර තුල දී සිදුකර ඇත.

2.6. විශේෂ ව්‍යාපෘති

2.6.1. *කඳුකර දශකය - දශවිධ බහුකාර්ය සංවර්ධන වැඩසටහන 2024-2033*

ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල ජනතාව මුහුණ දෙන සුවිශේෂී ගැටලු හා විෂමතාවයන් පිටුදැකීම සඳහා කඳුකර දශකය නමින් විශේෂ දස අවුරුදු සංවර්ධන වැඩසටහනක් දියත් කිරීමට රජය තීරණය කර ඇත.

මෙම වැඩසටහන දියත් කිරීම සඳහා දිවයිනේ මුහුදු මට්ටමේ සිට මීටර් 200 වඩා වැඩි උසකින් පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 89ක ග්‍රාම නිලධාරී වසම් 4,498කින් යුත් වැඩසටහන් බල ප්‍රදේශයක් ආරම්භක අවස්ථාවේ දී හඳුනා ගන්නා ලදී. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත රු.මිලි. 100ක් බැගින් 2024 වර්ෂය තුළ වෙන්කරන අතර ඒ සඳහා යෙදවෙන මුළු ප්‍රතිපාදනය රු.මිලි. 8,900කි. ඉතිරි රු.මිලි. 1,100ක ප්‍රතිපාදනය ගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි වැඩසටහන් බල ප්‍රදේශය තුළ ප්‍රමුඛතාගත කෙරෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවෙනු ඇත. ඒ අනුව, අයවැය 2024 මගින් ප්‍රතිපාදන වෙන් කිරීමේ දී යටෝක්ත වැඩසටහන දියත් කිරීම සඳහා රු.මිලි. 10,000ක ප්‍රතිපාදනයක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත වෙන් කර ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඉදිරිපත් වූ ඉල්ලීම් සලකා බැලීම මත මේ වන විට අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ප්‍රාදේශය ලේකම් කොට්ඨාසය ව්‍යාපෘති බල ප්‍රදේශයට එක්වීමත් සමග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ගණන 90ක් දක්වා ඉහළ ගිය අතර කළුතර දිස්ත්‍රික්කයේ මතුගම හා ඉංගිරිය, මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල හා ගලේවෙල, සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නොර්වුඩ් හා තලවාකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා විශේෂ ව්‍යාපෘති අනුමත කිරීමත් සමග ව්‍යාපෘති බල ප්‍රදේශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 97ක් දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇත.

2024.12.15 දින වන විට ජනාධිපති කාර්යාලය විසින් විශේෂ ව්‍යාපෘති ද ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 97ක අනුමත ව්‍යාපෘති 13,644ක සහ හා විශේෂ ව්‍යාපෘති 709ක එකතුවක් ලෙස ව්‍යාපෘති 14,353ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, 2024.12.15 දින වන විට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් අදාළ සංරචකය අනුව පිළිවෙලින් රු.මිලි. 8,899.98ක සහ රු.මිලි. 1,060.98ක එකතුවක් ලෙස රු.මිලි. 9,960.96ක ප්‍රතිපාදන නිදහස් කර ඇත.

එමෙන්ම, 2024.05.30 දින ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති සංශෝධනය කිරීම සඳහා වන විශේෂ අනුමැතිය ලබාදීම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා ඇත. ඒ අනුව, සංශෝධන සිදු කිරීමෙන් පසුව 2024.12.15 දින වන විට විශේෂ ව්‍යාපෘති ද ඇතුළුව මුළු ව්‍යාපෘති ගණන 14,452 දක්වා වැඩි වී ඇත.

"කඳුකර දශකය" බහුකාර්යය ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම මේ වන විට ආරම්භ කර ඇති අතර එම ව්‍යාපෘති ප්‍රධාන අංශ 10 යටතේ ක්‍රියාත්මක වේ. එම ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත පරිදි වේ:

2024.12.15 දින දක්වා ප්‍රතිපාදන අනුමත කර ඇති ආකාරය

විස්තරය	දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් (රු.මිලි.)	විශේෂ ව්‍යාපෘති (රු.මිලි.)	එකතුව (රු.මිලි.)
වෙන්කර ඇති ප්‍රතිපාදන	8,900.00	1,100.00	10,000.00
අනුමත කර ඇති ප්‍රතිපාදන	8,899.98	1,060.98	9,960.96
ඉතිරි ප්‍රතිපාදන	0.02	39.02	39.04

2024.11.30 දින දක්වා දිස්ත්‍රික් අනුව ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

#	දිස්ත්‍රික්කය	ආරම්භක අදියරේ පවතින ව්‍යාපෘති	ප්‍රසම්පාදන අදියරේ පවතින ව්‍යාපෘති	ක්‍රියාත්මක අදියරේ පවතින ව්‍යාපෘති	වැඩ අවසන් ව්‍යාපෘති	මුළු ව්‍යාපෘති ගණන
1	අම්පාර	0	0	0	13	13
2	බදුල්ල	81	216	127	2,116	2,540
3	ගාල්ල	0	16	34	521	571
4	කළුතර	8	40	51	150	249
5	මහනුවර	33	191	428	2,851	3,503
6	කෑගල්ල	34	188	45	2,235	2,502

7	කුරුණෑගල	4	15	8	481	508
8	මාතර	12	134	47	1,218	1,411
9	මාතලේ	5	33	93	566	697
10	නුවරඑළිය	2	42	46	578	668
11	රත්නපුර	59	278	145	1,308	1,790
එකතුව		**238**	**1,153**	**1,024**	**12,037**	**14,452**

2024.11.30 දින දක්වා දිස්ත්‍රික් අනුව ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

#	දිස්ත්‍රික්ක	ප්‍රතිපාදන (රු.මිලි.)	මුළු වියදම (රු.මිලි)	අතැති බිල්පත් ප්‍රමාණය (රු.මිලි)
1	අම්පාර	5.00	4.90	-
2	බදුල්ල	1,954.50	1,702.87	-
3	ගාල්ල	401.58	327.19	1.86
4	කළුතර	437.00	194.97	49.30
5	මහනුවර	2,081.54	1.659.31	-
6	කෑගල්ල	1,100.00	951.68	13.54
7	කුරුණෑගල	300.00	137.91	35.60
8	මාතර	601.34	462.21	1.06
9	මාතලේ	1,050.00	703.60	45.40
10	නුවරඑළිය	630.00	429.99	17.26
11	රත්නපුර	1.400.00	803.79	236.83
එකතුව		**9,960.96**	**7,378.42**	**400.84**

එමෙන්ම, එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන නිදහස් කිරීමෙන් පසුව රු.මිලි. 39.04 ප්‍රමාණයක් ඉතිරිව ඇති අතර මාතර දිස්ත්‍රික්කය මගින් රු.මිලි. 25ක් හා නුවරඑළිය දිස්ත්‍රික්ක මගින් රු.මිලි. 51ක ප්‍රතිපාදන ප්‍රමාණයක් නැවත මෙම අමාත්‍යාංශය වෙත පවරන ලදී.

2.6.2. *"මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රයේ සංක්‍රමණ නිවාස" ඉදිකිරීමේ ව්‍යාපෘතිය*

මන්නාරම මඩු දේවස්ථානයට පැමිණෙන බැතිමතුන් සඳහා නවාතැන් පහසුකම් ලබාදීමේ අරමුණින් ඉන්දියානු ආධාර මත මඩු දේවස්ථාන භූමියේ සංක්‍රමණ නිවාස 300ක් ඉදිකිරීම සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. 2020.08.18 දින ආරම්භ වූ මෙම ව්‍යාපෘතියේ ආරම්භක ඇස්තමේන්තුව රු.මිලි. 290.08කි.

මෙම ව්‍යාපෘතිය නියමිත කාලය තුල අවසන් නොවීම මත ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය විසින් එහි විෂයපථය සංශෝධන කර එම සංශෝධිත විෂයපථය අනුව 2024.04.25 දින රු.මි.400ක වටිනාකමකට ඇස්තමේන්තුව නැවත සංශෝධන කර ගිවිසුම්ගතව ඇත. ඒ අනුව නිවාස සංඛ්‍යාව 96ක් ලෙස සංශෝධනය විය. මෙම ව්‍යාපෘතියේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර ව්‍යාපෘති සම්බන්ධීකරණය නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි. 2024.12.31 දිනට මෙහි භෞතික ප්‍රගතිය 40% කි.

2.7. ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනය

2.7.1 ජාතික ඉදිකිරීම් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාවේ ජාතික ඉදිකිරීම් කර්මාන්තය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ නිවාස අංශය තුල ස්ථාපිත ඉංජිනේරු සේවා හා තාක්ශණ අංශය සහ ඉදිකිරීම් අංශය 2024 වර්ෂය තුල පහත පරිදි දායකත්වය සපයා ඇත.

- 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග 15 ක් සහ රීති 9 ක් අනුමත කල යුතුව ඇත. එයින් නියෝග 13 ක් ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන ඇති අතර, රීති 7 ක් ගැසට් පත්‍රයේ පළකර ඇත. තව දුරටත් එල කිරීමට ඇති නියෝග 2ක් සහ රීති දෙකක් සඳහා වන කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත.

- එයට අමතරව, මේ වන විට පළකර ඇති නියෝග 2ක් සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙම වර්ෂය තුල සිදු කරන ලද අතර අනුමැතිය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත.

- 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය සඳහා පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එයට තවදුරටත් අවශ්‍ය වන සංශෝධන ඇතුලත් කර ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශන සභාවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසු, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය.

- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතන නීතිය සංශෝධනය සඳහා පනත් කෙටුම්පතක් සතස් කර ඇති අතර, එය ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ එකඟතාව ලබා ගැනීම සඳහා එම ආයතනය වෙත යොමු කර ඇත. ඉන්පසු, එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු, ගැසට් පත්‍රයේ පල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

- පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් වූ ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව අදාල පාර්ශව සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා අමාත්‍යතුමාගේ වාර්තාව සැකසීම සඳහා වන කටයුතු මෙම වසර තුල සිදු කරන ලදී.

- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැලැක්වීම සඳහා දේපළ වෙළඳාම් ක්ෂේත්‍රය නියාමනය කිරීමේ අවශ්‍යතාවය අනුව, ඒ සඳහා වන කාර්ය බලකාය අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් යුතුව පත් කරන ලද අතර එමගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත මෙම කාර්යට අදාළව සංශෝධනය කිරීමට අවශ්‍ය යෝජනා ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කර අදාළ කටයුතු සිදු කරන ලදී.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ නිරන්තර සාකච්ඡා පවත්වන ලද අතර එමගින් යොජනා වූ, ඉදිකිරීම් කර්මාන්තය වෙත කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ බලපෑම් අවම කිරීම සඳහා වන යෝජනා ඇතුලත්, අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය සහ එහි සඳහන් එක් එක් යෝජනා අධ්‍යයනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි. එහෙත්, නව අමාත්‍ය මණ්ඩලයක් පත් වූ බැවින් එම අනුමැතිය පරිදි ක්‍රියා කිරීමට අවසර ලබා ගැනීමට නැවත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
- 2024 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති 46ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා දී අදාල අමාත්‍යාංශ වෙත භාර දී ඇත.

- ස්ථාවර තාක්ෂණ කමිටුවේ අනුමැතිය ලද ව්‍යාපෘතීන්ට අදාලව අභියාචනා කැඳවීමේ ක්‍රම වේදයක් සකස් කර,ඒ ඔස්සේ අභියාචනා 2ක් අනුමත කර අදාල අමාත්‍යාංශ වෙත භාර දී ඇත.
- ස්ථාවර තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කෙරෙන ව්‍යාපෘති සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස්කරන ලදී.

2025 ඉදිරි දැක්ම

- 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතන නීතිය සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ තවදුරටත් අනුමත කර ගැනීමට ඇත. නියෝග 2ක් සහ රීති දෙකක් ගැසට් පත්‍රයේ පල කිරීම සහ නියෝග පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගැනීම සහ සංශෝධිත නියෝග දෙකක් ගැසට්පත්‍රයේ පල කර පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගැනීම.
- ස්ථාවර තාක්ෂණ කමිටුව මඟින් රජයේ සියලු ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාණ පත්‍රිකා වල මිල ගණන් අවසරලත් සීමාවන් තුළ ඇත්දැයි පරීක්ෂා කිරීමේදී නව්‍යකරණයට ලක් වෙමින්, ව්‍යුහාත්මක ප්‍රගතිදායක සැලැස්මක් අනුව රජයේ ඉදිකිරීම් අංශයෙහි අතිරේකව වැයවන මූල්‍ය පිරිවැය කලමනාකරණයට අවශ්‍ය සහාය ලබා දීම.
- තාක්ෂණික මෙන්ම පාලනමය, සංවර්ධන සහාය සඳහා මහ පෙන්වීම ලබා දීම තුළින් ජාතික ආර්ථිකය ගොඩනැංවීමට අවශ්‍ය රුකුල මෙම ආයතන ඔස්සේ ලබා දීමට, විදේශ විනිමය රට තුළට ලබා ගැනීමට මෙන්ම ජාතිකමය වශයෙන් තාක්ෂණික සහ ඉංජිනේරු වශයෙන් ජාතික සම්පත් සුරක්ෂිත කිරීම තුළින් රාජ්‍ය අංශය ඔස්සේ අතිරේකව වැයවන පිරිවැය, මූල්‍යමය ශක්තීන් ඉතිරි කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති යාවත්කාලීන කිරීමට මග පෙන්වීම.
- නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා විසා බලපත්‍රයක් ඉල්ලුවිට, එම ඉල්ලීම් පරීක්ෂා කර බලපත්‍රය ලබා ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම යටතේ ආයතන 5 කින් පමණ ඉල්ලුම් කරන ලද ව්‍යක්තිකයන්ට විසා බලපත්‍ර ලබා දීම සුදුසු දැයි පරීක්ෂා කර බලා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ යොමුකර ඇත.

2.7.2. <u>අනෙකුත් ඉදිකිරීම් කටයුතු</u>

- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ සෙත්සිරිපාය අදියර I හි පිහිටි නිවාස හා ඉදිකිරීම් අංශයේ ගිණුම්, සැලසුම් සහ අභ්‍යන්තර විගණන අංශවල නවීකරණ කටයුතු

3.0. අමාත්‍යාංශයේ සාමාන්‍ය පාලන කටයුතු

3.1. පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය

මෙම අමාත්‍යාංශයට. අදාළ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ රාජකාරි එනම්, වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම, සේවය ස්ථීර කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම්, වැඩ බැලීම සඳහා පත් කිරීම හා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීම යන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

3.2. මූල්‍ය කළමනාකරණය

අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් රෙගුලාසි 135 යටතේ පවරන ලද බලතල ප්‍රකාරව පාලන අංශය වෙත ලැබෙන සියලුම වියදම් එනම්, ගෙවීම් වවුචර්, ආපදා ණය / විශේෂ අත්තිකාරම් ඉල්ලීම් අදාළ ගෙවීම් වල නිරවද්‍ය බව පරීක්ෂා කර බලා අනුමැතිය හා නිර්දේශ ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

3.3. අමාත්‍ය මණ්ඩල සංදේශ

2024 වර්ෂයේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ 99ක් අදාල අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇත. එමෙන්ම, අමාත්‍යාංශය වෙත යොමු වූ පාර්ලිමේන්තු ප්‍රශ්න 06ක් සඳහා පිළිතුරු සැපයීමට අදාළ කටයුතු සිදු කර ඇත.

3.4. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කාර්යසාධන වාර්තා, වාර්ෂික වාර්තා -2024

මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අදාළව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කර ඇති වාර්ෂික වාර්තා/ කර්යසාධන වාර්තා ගණන 14ක් වන අතර පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වර්තා ගණන 01කි.

3.5. පුහුණු වැඩසටහන් පැවැත්වීම

2024 වර්ෂයේදී අමාත්‍යාංශයට ලද පුහුණුවීම් සඳහා මාණ්ඩලික නිලධාරී 04ක් සහ අනෙකුත් නිලධාරීන් 114 දේශීය පුහුණු සඳහා යොමු කර ඇත. 2024 වර්ෂයේ මෙම අමාත්‍යාංශයෙන් නිලධාරීන් 10 දෙනෙකු විදේශීය පුහුණු සහ සම්මන්ත්‍රණ සඳහා යොමු වී ඇත.

3.6. මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

2024 වර්ෂයට අදාළව ජනාධිපති කාර්යාලයෙන් හා අගමැති කාර්යාලයෙන් නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන අංශය වෙත යොමු කරන ලද මහජන ඉල්ලීම් ලිපි ගණන 458කට අදාළව නොපමාවම කටයුතු කරන ලද අතර ආයතනික හා වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට ද කටයුතු කර ඇත.

3.7. තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම

තොරතුරු දැනගැනීමේ පනතට අදාළව ඉල්ලීම් 46ක් ඉදිරිපත් වී ඇති අතර ඊට සම්බන්ධව සෘජුව ඉටුකළ හැකි තොරතුරු ඉල්ලීම් 29ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර, මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළව ඉදිරිපත් වූ ඉල්ලීම් ඉදිරි කටයුතු සඳහා එම ආයතනවලට යොමු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. තොරතුරු දැනගැනීමේ පනතට අනුව ප්‍රතික්ෂේප කර ඇති ඉල්ලීම් ගණන 02කි.

4.0. අධීක්ෂණය හා ඇගයීම

4.1. ප්‍රගති වාර්තාකරණය

ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද ජාතික විගණන උප කාර්යාලය සහ අමාත්‍යාංශයේ විගණන අංශය, මූල්‍ය අංශය ඇතුළු අනෙකුත් අංශ වෙත මාසිකවද අවස්ථානුකූලව ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය යනාදී ආයතනවලටද අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගතිය අවශ්‍ය පරිදි වාර්තා කරන ලදී. එමෙන්ම, අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව අයවැය විවාදය සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සාමාන්‍ය පරිපාලන අංශය වෙතවෙත යොමු කරන ලදී.

4.2. ප්‍රගති සමාලෝචන රැස්වීම්

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ, රාජ්‍ය අමාත්‍යතුමාගේ සහ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ඉදිකිරීම් අංශයේ ආයතන වන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, ඕෂන් වීව් සංවර්ධන (පුද්.) සමාගම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සහ නැවත පදිංචි කිරීමේ අංශය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 07ක් සංවිධානය කරන ලදී. ඉන්දියානු රජයේ ආධාර යටතේ නිවාස ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 08ක් පවත්වා ඇති අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ ද ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

4.3. වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2024 වර්ෂය සඳහා ද අමාත්‍යාංශය අනුබද්ධිත ආයතනවලට සහ ව්‍යාපෘතිවලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම නියමිත පරිදි ඉදිරිපත් කර අනුමැතිය ලබාදීමට කටයුතු කර ඇත.

4.4. සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම

2024 වර්ෂය අවසාන වන විට මෙම අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති 5 ක් පැවතිණි. එම සියළුම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ ඉන්දියානු රජය විසිනි. ඒ සඳහා යටිතල පහසුකම් සැපයීම සහ අත්‍යාවශ්‍ය අතිරේක වැඩ කොටස් සඳහා භාණ්ඩාගාරයෙන් ද ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලැබේ.

ඉන්දියානු රජයේ මූල්‍යාධාර මත ආරම්භ වූ අනුරාධපුර, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමි ගම්මානයේ නිවාස 153ක් සහ සංගාවාසයේ ඉදිකිරීම් කීපයක් සහිතව ව්‍යාපෘතිය රු.මි.300ක ආධාර මගින් 2018 වසරේ ආරම්භ කරන ලදී. කොන්ත්‍රාත් ආයතනයේ අකාර්යක්ෂමතාවය මත වසර කීපයක් ප්‍රමාද වීම සහ ඉදිකිරීම් වියදම් ඉහල යාම හේතුවෙන් ඉන්දියානු ආධාර ප්‍රමාණවත් නොවීම මත භාණ්ඩාගාර ප්‍රතිපාදනද රු.මි.100ක් සහිතව නැවත වෙනත් කොන්ත්‍රාත් ආයතනයක් මගින් ආරම්භ කර 2024 වසර තුල සංගාවාසයේ ඉදිකිරීම් සහ නිවාස 56ක වැඩ කටයුතු නිම කිරීමට හැකි විය. අතිරේක ඉන්දියානු ප්‍රතිපාදන රු.මි.150.50ක් 2023 වසර තුල ලැබීමෙන් අනතුරුව 2025 තුල ඉතිරි සියළු ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

අනෙකුත් ඉන්දියානු නිවාස වැඩසටහන් 04 ද මේ වනවිට සැලකිය යුතු ප්‍රගතියක් ලඟාකරගෙන ඇත. මෙම ව්‍යාපෘති 04ට අයත් නිවාස 2400න් 2070ක වැඩ ආරම්භ කර, 2024 වසර අවසන් වන විට නිවාස 836ක වැඩ අවසන් කර ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. වර්තමානයේ පවතින ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහලයාම සහ ප්‍රතිලාභීන්ගේ ආර්ථික අපහසුතා හේතුවෙන් මේ වන විට ඉතිරි නිවාස ඉදිකිරීම් මන්දගාමීව සිදු වන අතර ආධාර මුදල් වැඩිකිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ සාකච්ඡා කර කිහිපවාරයක් පවත්වා අතිරේක ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ඉදිරි කටයුතු සැලසුම් කරනු ඇත.

එමෙන්ම, 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද කඳුකර දශකය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා ජනාධිපති කාර්යාලය වෙතින් ප්‍රතිපාදන නිදහස් කිරීමට අනුමැතිය ලද විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.

5.0. අභ්‍යන්තර විගණනය

2024 වර්ෂයේ දී විගණන වාර්තා 68ක් සහ විගණන විමසුම් 17ක කටයුතු අවසන් කර ඇත. 2024.12.31 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 08ක් පවත්වා ඇත. අනුබද්ධිත ආයතනයන් හි විමර්ශන 53ක් අවසන් කර ඇත.

2025 වර්ෂයේ දී විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටු කිරීමටත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් කාර්තුමය වශයෙන් පැවැත්වීමට විගණන වැඩසටහනට ඇතුළත් කර ගෙන ඇත.


රංජිත් ආරියරත්න
ලේකම්/ප්‍රධාන ගනන් දීමේ නිලධාරී
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

රංජිත් ආරියරත්න
ලේකම්
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
12වන මහල, "සෙත්සිරිපාය" (අදියර II), බත්තරමුල්ල.

පරිච්ඡේදය 3

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍යකාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශනය




ඒසිඒ-එන්

නාගරික සංවර්ධන,ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	2024 රු.	2023 රු.	
			කුසල		
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
			-	-	
-	ආදායම් නොවන ලැබීම්		14,529,527,754	20,218,644,495	ඒසිඒ-3
-	භාණ්ඩාගාර අග්‍රිම		59,257,074	364,448,586	ඒසිඒ-4
-	තැන්පතු		29,530,657	71,808,146	ඒසිඒ-5
-	අත්තිකාරම් ගිණුම්			-	
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		14,618,315,485	20,654,901,227	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)				
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්		14,618,315,485	20,654,901,227	
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		154,784,650		
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්		14,463,530,835	20,654,901,227	
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)				
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
444,086,500	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	417,407,055	584,203,573	
484,586,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	416,193,786	521,440,022	ඒසිඒ-2(ii)
920,253,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	684,878,304	752,372,859	
-	පොළී ගෙවීම්	8	-	-	
500,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	170,000	20,040,000	
1,849,425,500	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,518,649,145	1,878,056,454	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
46,600,000	වැඩිදියුණු කිරීම්	10	25,280,307	50,626,033	
31,711,461,088	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	20,107,336,777	461,663,430	
8,188,350,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	7,065,001,817	3,957,160,778	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	814,150	2,289,000	
10,665,363,412	වෙනත් මූලධන වියදම්	15	9,097,382,644	26,349,339,480	
50,612,774,500	මුළු මූලධන වියදම් (උ)		36,295,815,695	30,821,078,721	
	තැන්පතු ගෙවීම්		627,198,895	549,852,578	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		30,873,129	34,400,564	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		658,072,024	584,253,142	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		38,472,536,864	33,283,388,317	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(24,009,006,029)	(12,628,487,090)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		24,010,098,638	(12,628,487,090)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,092,609		ඒසිඒ-3
			-	-	

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය



එසිඒ-8

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එසිඒ-6	47,427,178,360	870,642,638
කෙරිගෙන යන වැඩ		57,232,291,859	1,382,607,311
අස්පෘශ්‍ය වත්කම්		6,787,950	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(ඒ)	518,810,880	138,374,624
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3	1,092,609	-
මුළු වත්කම්		105,186,161,658	2,391,624,573
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		-1,131,780,603	-1,701,064,896
දේපළ පිරියත හා උපකරණ සංචිතය		47,427,178,360	870,642,638
කෙරිගෙන යන වැඩ		57,232,291,859	1,382,607,311
අස්පෘශ්‍ය වත්කම්		6,787,950	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසිඒ-5(බී)	452,311,720	73,217,936
ප්‍රංගම වගකීම්			
කෑන්පතු ගිණුම්	එසිඒ-4	1,198,279,763	1,766,221,584
අග්‍රිම ශේෂය	එසිඒ-3	1,092,609	
මුළු වගකීම්		105,186,161,658	2,391,624,573

පිටු අංක...10... .සිට ...66. දක්වා එසිඒ 1 සිට එසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...67... සිට .....78.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 28/03/2025	දිනය :	දිනය : 28/03/2025
රංජිත් ආරියරත්න		එච්.පී. ලලිත් කුමාර
ලේකම්		ප්‍රධාන මූල්‍ය නිලධාරි
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය		නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
12වන මහල, "සෙත්සිරිපාය" (අදියර II), බත්තරමුල්ල.		12 වන මහල, "සෙත්සිරිපාය" (අදියර II)
		බත්තරමුල්ල.

2

3.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

එළිප්-සී

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	446,915,191	138,659,482
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	14,529,527,754	20,218,644,495
අත්කිකාරම් අයකර ගැනීම්	25,311,129	24,996,561
කැන්පතු ලැබීම්	59,257,074	317,163,737
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	15,061,011,147	20,699,464,275
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ධ පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	830,579,992	826,335,464
සහනාධාර සහ මාරුකිරීම්	13,188,055	13,917,646
ප්‍රාග්ධන වැය ශීර්ෂ මඟඋපයෝජන දර්ශා ලද වියදම්	103,899,511	90,677,250
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	154,784,650	
අත්කිකාරම් ගෙවීම්	31,004,461	33,082,993
කැන්පතු ගෙවීම්	627,198,895	494,621,891
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,760,655,563	1,458,635,245
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	13,300,355,584	19,240,829,030
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	16,134,882,562	19,240,829,030
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	16,134,882,562	19,240,829,030
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(16,134,882,562)	(19,240,829,030)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(2,834,526,978)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	
ප්‍රදානයන් ලැබීම්	2,835,619,587	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	2,835,619,587	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	2,835,619,587	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	1,092,609	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	1,092,609	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

6

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුවට		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
නොමැත.	-	-	-	-	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	1,796,300,000.00	1,849,425,500.00	1,518,649,146.00	82.11
ප්‍රාග්ධන	50,598,000,000.00	50,612,774,500.00	36,295,815,694.00	71.71

3.7. මූ.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවලට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	සංචාරක අමාත්‍යාංශය	කිතුල්ගල පින්නවල සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම.	166,479,909.91	166,479,909.91	100,965,340.70	61

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		46,540,865,888.00		
9152	යන්ත්‍රෝපකරණ		886,312,471.00		
9153	ඉඩම්		-		
9154	අස්පෘශ්‍ය වත්කම්		6,787,950.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		57,232,291,859.00		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 03 මගින් ඉදිරිපත් කර ඇත

පරිච්ඡේදය 4
කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැකැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
ප්‍රතිලාභීන් සඳහා ලබාදෙන ලද නිවාස ඒකක සංඛ්‍යාව	104.83		
අවතැන් වූ පවුල්වල සුභසාධනය වෙනුවෙන් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ගණන	99.8		
බිම්බෝම්බවලින් තොර භූමි ප්‍රදේශ (ව.කිමී.)	119.8		
තිරසාර, ජීවත්විය හැකි නගර			
- ප්‍රකාශිත නාගරික ප්‍රදේශ සඳහා සකස් කරන ලද සංවර්ධන සැලසුම් ගණන	100		
2024 දී රුපියල් බිලියන 1.2 ක වාර්ෂික ආදායමක් ලබා ගැනීම.	85		

පරිච්ඡේදය 5
තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
11/11.1	"ඔබට ගෙයක් රටට හෙටක්", "සැමට නිවහන" ණය - නව, "සැමට නිවහන" ණය - (අවිච්ඡේද) , සෙවණ ආධාර වැඩසටහන (අවිච්ඡේද) ", "සෙවණ ආධාර වැඩසටහන (නව) ", "සැමට නිවහන ණය - (අවිච්ඡේද) ", "සැමට නිවහන" ණය - නව, "සැමට නිවහන සේවාභිමාණි ණය (වැඩිදියුණු) ", "සියනෑ නේර්වර් පාර්ක්", "රීජන්සී පාර්ක්" නිවාස වැඩසටහන් මගින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදීමට අපේක්ෂිත නිවාස ඒකක ප්‍රමාණය - 7500	අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබා දෙන ලද නිවාස ඒකක ප්‍රමාණය - 8187			√
	උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් සඳහා ඉදිකිරීමට අපේක්ෂිත නිවාස ඒකක ප්‍රමාණය - 2,107	ඉදිකරන ලද නිවාස ඒකක ප්‍රමාණය - 1,785			√
	මධ්‍යම ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඒකක 4000ක් ලබා දීම.	2024 සඳහා නිවාස ඒකක 500			√
	අවතැන් වූ පවුල්වල සුභසාධනය වෙනුවෙන් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රමාණය - 5,904	අවසන් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය - 5,893			√
	නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවාස ඒකක 786 ක් 100% ක් ඉදිකිරීම.	100% නිමකිරීම			√

	චීන ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවාස ඒකක 1996 ක් ඉදිකිරීම. - විදේශීය සංරචක (%)	17.6% නිමකිරීම	√		
	ii. චීන ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවාස ඒකක 1996 ක් ඉදිකිරීම. - **දේශීය සංරචකය** (ඉඩම් අත්පත් කර ගැනීම, ඉඩම් සංවර්ධනය, සැලසුම් උපදේශනය, කොන්ත්‍රාත් පරිපාලනය, කොන්ත්‍රාත් අධීක්ෂණය, ව්‍යාපෘති යටිතල පහසුකම්, ව්‍යාපෘති පොදු කාර්ය වියදම් සහ නැවත ස්ථානගත කිරීම) (%)	21.46% නිමකිරීම	√		
11/11.3/ 11.3.1		ජනගහන වර්ධන අනුපාතයට ඉඩම් පරිභෝජන අනුපාතය	√		
	ප්‍රකාශිත නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම.	සකස් කරන ලද සංවර්ධන සැලසුම් ගණන - 26			√
11/11.4	සංස්කෘතික හා උරුම කළමනාකරණ සැලැස්ම සඳහා තිරසාර පාරිසරික උපාය මාර්ග සකස් කිරීම.	තිරසාර පාරිසරික උපාය මාර්ග ඇතුළත් සංවර්ධන සැලසුම් ගණන - 26			√
11/11.5	වැසි වතුර නිසා ඇති වන හදිසි ගංවතුර තත්ත්වයකදී ආපදාවට ලක්වන භූමි ප්‍රමාණය අවම කර ගැනීම.	වැසි වතුර නිසා ඇති වන ගංවතුර පාලනය කිරීමේ ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රගතිය - 99.5%			√
11/11.7	සංවර්ධන සැලසුම් ප්‍රදේශය සඳහා පොදු එළිමහන් විනෝදාත්මක අවකාශ සැලසුම් සඳහා තිරසාර පාරිසරික උපාය මාර්ග සකස් කිරීම.	තිරසාර පාරිසරික උපාය මාර්ග ඇතුළත් සංවර්ධන සැලසුම් ගණන - 26			√

11/11.අ		කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	√		
11/11.ආ	අනතුරුදායක ප්‍රදේශ සඳහා තිරසාර පාරිසරික උපාය මාර්ග සකස් කිරීම.	තිරසාර පාරිසරික උපාය මාර්ග ඇතුළත් සංවර්ධන සැලසුම් ගණන - 26			√
11/11.ඇ	ජාතික හරිත ගොඩනැගිලි සහතික කිරීම	ඉල්ලීම මත කාල සීමාව තුළ සහතිකය නිකුත් කිරීම			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

අරමුණ/ ඉලක්කය	ජයග්‍රහණ	අභියෝග
11/11.1		ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රමාදය, ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද වීමට හේතු විය.
		අවතැන් වූ පවුල් සඳහා වූ ස්ථිර නිවාස ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් විසින්ම ඉදිකරනු ලබන පදනම මත ක්‍රියාත්මක වන බැවින් ප්‍රතිලාභීන්ට ඉහළ දායකත්වයක් දැරීමට සිදුව ඇත. පසුගිය කාල වකවානුවේදී අඛණ්ඩව නිවාස ඉදිකිරීමේ අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යාම හේතුවෙන් මෙම නිවාස සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන තුල නිම කිරීමට සිදුවීම ප්‍රතිලාභීන් මුහුණ දෙන අභියෝගයක් ලෙස දැක්විය හැක.
11/11.3	නගර සංවර්ධන සැලසුම් 12 ක් 2024.12.31 දිනට පෙර ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම.	

11/11.5	2024 වසර තුලදී ඇතිවූ වැසි වතුර නිසා ඇති වන හදිසි ගංවතුර තත්ත්වයන්හීදී එය මනාලෙස කළමනාකරණය කිරීමට හැකිවිය. ඒ සඳහා සිදුකල ව්‍යාපෘති; * ඇළ මාර්ග, වැව් සහ ඇවිදින මංතීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘති - 09 * ගංවතුර පාලනය ව්‍යාපෘති - 09 * තෙත්බිම් සහ පහත්බිම් සංවර්ධනය ව්‍යාපෘති - 08 * නිර්මාණ කටයුතු, සිතියම්කරණය සහ ශක්‍යතා අධ්‍යයනය ව්‍යාපෘති - 05	* වැසි වතුර නිසා ඇති වන හදිසි ගංවතුර තත්ත්වයකදී ආපදාවට ලක්විය හැකියැයි හඳුනාගත් ජනතාව වන්දි ලබාදී එම ප්‍රදේශ වලින් ඉවත් කර එම ඉඩම් ජල රක්ෂිත ලෙස ප්‍රකාශ කර තිබුනද, නැවත නැවතත් එම ඉඩම්හි අනවසර පදිංචිවීම් සිදුවිම. * එසේම ජල රක්ෂිත ලෙස නිදහස්ව තිබියයුතු පහත ඉඩම්, නීති විරෝධී ලෙස ගොඩකිරීම් සිදුකිරීම.
11/11.අ		සැලසුම්කරණයට අදාලව පවතින මානව සම්පත් හිගය

පරිච්ඡේදය 6
මානව සම්පත් පැතිකඩ

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

#	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	81	66	15
තෘතීයික	9	6	03
ද්විතීයික	399	342	57
ප්‍රාථමික	108	86	22

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ආකෘති පත්‍රය අනුව සකස්කරන ලද අමාතයාංශයේ කාර්යමණ්ඩලය 2024.12.31 දිනට (ජල සම්පාදන අංශය හැර) ඇමුණුම 02 මගින් දක්වා ඇත.

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අමාත්‍යාංශය තුල මේ වන විට මානව සම්පත් හිඟයක් පවතී. විශේෂයෙන් සහකාර ලේකම්, සහකාර අධ්‍යක්ෂකවරුන්, ගණකාධිකාරීවරුන්, අභ්‍යන්තර විගණකවරුන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, රියදුරන්, කාර්යාල කාර්ය සේවක නිලධාරීන්ගේ හිඟය අමාත්‍යාංශයේ ප්‍රශස්ථ කාර්යසාධනය සඳහා සෘජුවම බලපානු ලබයි. රජයේ ඉදිරි දැක්මද සැලකිල්ලට ගනු ලැබූ විට තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ හිඟය ද තොරතුරු පද්ධති සැකසීම වැනි කටයුතුවල දී සෘජුවම බලපානු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පූර්ණ කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය(දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	01	මාස 06	60,000.00	-	දේශීය	
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	02	මාස 06	120,000.00	-	දේශීය	
රාජ්‍ය ප්‍රසම්පාදන හා සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය	01	අවු 1.5	256, 200.00	-	දේශීය	
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	01	අවු 1	138,000.00	-	දේශීය	
සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩයිම් විභාගය සඳහා සම්මන්ත්‍රණ 1. ගිණුම් ක්‍රම	113	පැය 20	15,600.00	-	දේශීය	

2. කාර්යාල ක්‍රම 3. තොරතුරු තාක්ෂණය						
Belt and Road Initiative යටතේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වෘත්තිකයන් සඳහා බාධක-නිදහස් ප්‍රවේශය පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.03.20 –24.04.02	143,740.50	-	විදේශීය	
ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් ඩිජිටල් සේද මාවතක් ඒකාබද්ධව ගොඩනැගීම සහ Belt and Road Initiative සහිත රටවල් සඳහා ගෝලීය ඩිජිටල් සහයෝගීතාවයේ නව රටාවක් ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.04.19 24.04.25	140,597.30	-	විදේශීය	
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.04.29 – 24.05.12	139,197.00	-	විදේශීය	
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඝන අපද්‍රව්‍ය වැළැක්වීම සහ පාලන තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.05.16 – 24.05.19	140,387.30	-	විදේශීය	
Belt and Road Initiative රටවල් සඳහා පාරිසරික ශිෂ්ටාචාරය සහ හරිත සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	01	24.06.06 – 24.06.19	141,489.80	-	විදේශීය	
ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව යටතේ ශ්‍රී ලංකාවේ දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් සඳහා වන සිව්වන මැදි වෘත්තීය පුහුණු වැඩසටහන	01	24.08.19-2024.08.30		-	විදේශීය	
Belt and Road Initiative හවුල්කාර රටවල් සඳහා නව යටිතල පහසුකම් ඉදිකිරීම් සහ කාර්මික පරිවර්තනය සහ වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	02	24.09.12 – 24.09.25		-	විදේශීය	
SCP: සුහුරු ජාතියක් පිළිබඳ දැක්මක් කරා නාගරික සංවර්ධනය	01	24.09.30 – 24.10.	ඇ.ජ.එ. ඩො.162 (රු. 48,438 ආසන්න මුදලක්)	-	විදේශීය	
දකුණු ආසියානු කළඹ සංසදය 2024 (බාලි, ඉන්දුනීසියාව)	01	24.11.11 – 24.11.13		-	විදේශීය	

පරිච්ඡේදය 7
අනුකූලතා වාර්තාව


#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවරවත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කරපවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIAS) පිළියෙළ කර නියමිත දිනට මහභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය මත වත්කම් යාවත්කාලීන ක්‍රමවේදයක් සකස් කරන බැවින් මෙම ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවේ.	
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අදාළ නොවේ	එවැනි ගැළපුම් කළයුතු ශේෂයන් නොමැත් වීම.	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1)ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහාවන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාන්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකොට තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	ආදායම් එකතු කරන ආයතනයක් නොවන බැවින් අමාත්‍යාංශයට අදාළ නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා එල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සක් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		



ක.ස. – 75 ස.නි. – 310 කා.කා.ස. – 56 රියදුරු – 50 කා.කා.ස. (දෙපාර්තමේන්තු) -1

යටි සටහන: 1. අතිරේක ලේකම් (ශ්‍රී.ල.ප.සේ.) විශේෂ – තනතුරු 2
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් සහ මෙහෙයුම්) – ශ්‍රී.ල.ක්‍ර.සේ. – විශේෂ – තනතුරු 1 } මෙම නිලධාරීන් විශ්‍රාම යෑම හේතුවෙන් ඉහත සංවිධාන සටහනට ඇතුළත් කර නොමැත.

2. * තනතුරු දරන තැනැත්තන්.

3. අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) ශ්‍රී.ල.ක්‍ර.සේ. (විශේෂ) විශ්‍රාම දිනය 15/12/2023 වේ. එම නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසු නාගරික සංවර්ධන සැලසුම් ඒකකය සහ පරිසර ආරක්ෂණ සැලසුම් ඒකකය එකතු කර අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.ක්‍ර.සේ. විශේෂ) තනතුරු 2ක් පහත පරිදි පත් කිරීමට නියමිතය.

I. අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන සහ **පරිසර ආරක්ෂණ**) - ශ්‍රී.ල.ක්‍ර.සේ. - විශේෂ
II. අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) - ශ්‍රී.ල.ක්‍ර.සේ. - විශේෂ

ඇමුණුම 1-1

සාමාන්‍ය පාලන අංශය

අභ්‍යන්තර විගණන අංශය

සැලසුම් හා මෙහෙයුම් අංශය

අතිරේක ලේකම් (සාමාන්‍ය පාලන) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

ප්‍රධාන මූල්‍ය නිලධාරී I ශ්‍රී.ල.ග.සේ (විශේෂ)

ප්‍රධාන මූල්‍ය නිලධාරී II ශ්‍රී.ල.ග.සේ (විශේෂ)

ජේ.ස.ලේ. (පාලන) ශ්‍රී.ල.ප.සේ I

ජේ.ස.ලේ (ප්‍රවාහන හා නඩත්තු) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ඉඩම් සහ නීති) ශ්‍රී.ල.ප.සේ I

ප්‍රධාන ගණකාධිකාරී (සාමාන්‍ය පරිපාලන

ප්‍රධාන ගණකාධිකාරී (නා.ස. සහ ප.ආ.)

ප්‍රධාන ගණකාධිකාරී (නිවාස හා ඉදිකිරීම්) ශ්‍රී.ල.ප.සේ I -I

ප්‍රධාන ගණකාධිකාරී (සාමාන්‍ය පරිපාලන II) ශ්‍රී.ල.ප.සේ

ප්‍රධාන අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ (I) - (3)

* අතිරේක ලේකම් ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (පරිසර ආරක්ෂණ) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

* අධ්‍යක්ෂ ජනරාල් (නිවාස) ශ්‍රී.ලං.ක්‍ර.සේ (විශේෂ)

නි.අ./ස.අ (ශ්‍රී.ලං. නො.හා ස.නා.සේ

ස.ලේ.- (පාලන) (ශ්‍රී.ල.ප.සේ II/III)

ස.ලේ (ප්‍රවාහන හා නඩත්තු) (ශ්‍රී.ල.ප.සේ II/III)

නි.අ./ස.අ (ප්‍රතිපත්ති) ශ්‍රී.ල.ප.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ල.ප.සේ (II/III)

ස.අ. ශ්‍රී.ලං.ක්‍ර.සේ අධීක්ෂක (II/III)

නීති නිලධාරී (2)

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ

ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ (II/III)

අභ්‍ය. විගණක ශ්‍රී.ල.ග.සේ (II/III) (2)

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ 1

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ I

අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ I

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.සේ (II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) II/III

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) II/III

පරිපාලන නිලධාරී

නො.නා. නිලධාරී -3

භාෂා පරිවර්තක -2

පිළිගැනීමේ නිලධාරී

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ. නි.

ස.නි. ක.සේ.නි

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ. නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

ස.නි. ක.සේ.නි.

නො.නා.සහකාර - 2 කා.කා.ස.

විසියෝ ශිල්පී (දෙපා.) ඡායාරූප ශිල්පී (දෙපා.) සහකාර ඡායාරූප ශිල්පී (දෙපා.) කා.කා.ස.

රියදුරු කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

ඇමුණුම 1-2

2023.12.15 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

ව්‍යාපෘති මෙහෙයුම් අංශය

අතිරේක ලේකම් (ව්‍යාපෘති මෙහෙයුම්)
ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

ජේ.ස.ලේ. (ව්‍යාපෘති මෙහෙයුම්) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍යක්ෂ (ව්‍යාපෘති) ශ්‍රී.ලං.ක්‍ර.සේ I

අධ්‍යක්ෂ (සේවා සහ කොන්ත්‍රාත් පාලන) ශ්‍රී.ලං.ඉ.සේ I

ස.ලේ. ශ්‍රී.ල.ප.සේ II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.වි.සේ (II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ අධිසේවක II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ අධිසේවක II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ (II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස.සේ (II/III)

පරිපාලන නිලධාරී

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි. නා.නි. (2), ක.සේ.නි.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

කා.කා.ස.

නිවාස සහ ඉදිකිරීම් අංශය

අතිරේක ලේකම් (නිවාස සහ ඉදිකිරීම්) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නිවාස හා ඉදිකිරීම්) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා හා නාක්.) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

ජේ.ස.ලේ (නි. සහ ඉ.) ශ්‍රී.ල.ප.ස සේ I

අධ්‍ය. (නිවාස) ශ්‍රී.ල.ප.ස සේ I

අධ්‍ය. (නැවත පදිංචි කිරීම්) ශ්‍රී.ල.ප.සේ. I

ජාතික නිවාස කොමසා.

අධ්‍ය. ශ්‍රී.ලං.ඉ. සේ. I

අධ්‍ය. ශ්‍රී.ලං.ඉ. සේ. I

අධ්‍ය. (ඉංජී. සේවා) ශ්‍රී.ලං.ඉ.සේ. I

ස.ලේ. (නි. හා ඉ.) ශ්‍රී.ල.ප.සේ. (II/III)

ස.ලේ. (නි. හා ඉ.) ශ්‍රී.ල.ප.ස. සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ල.ප.සේ. (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස.සේ (II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.ස සේ(II/III)

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ II/III

පරිපාලන නිලධාරී

ස.නි., ක.ස. – 1(දෙපා) ලිපිකරු - 2(දෙපා) යතුරු ලියන්නන් - 1(දෙපා) ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., නා.නි. (3), ක.සේ.නි.

කා.කා.ස. කා.කා.ස. -1 (දෙපා.)

කා.කා.ස.

කා.කා.ස.

කා.කා

කා.කා

කා.කා.ස.

නාගරික සංවර්ධන හා පරිසර ආරක්ෂණ අංශය

අතිරේක ලේකම් (නාගරික සංවර්ධන සහ පරිසර ආරක්ෂණ) ශ්‍රී.ල.ප.සේ. (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (නාගරික සංවර්ධන) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

අධ්‍යක්ෂ ජනරාල් (පරිසර ආරක්ෂණ හා නාක්ෂණ) ශ්‍රී.ලං.ඉ.සේ (විශේෂ)

ජේ.ස.ලේ. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍ය. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. I

අධ්‍ය. (නා.සං.) ශ්‍රී.ලං.ඉ.සේ. I

අධ්‍ය. (පරිසර ආරක්ෂණ හා නාක්ෂණ) ශ්‍රී.ලං.ඉ.සේ. 1

ස.ලේ. (නා.සං.සහ ප.ආ.) ශ්‍රී.ල.ප.සේ. II/III

නි.අ./ස.අ ශ්‍රී.ලං.ඉ.සේ.

ස.අ (දෙපා) නා.සං. II/III

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ඉ.සේ. II/III)

නි.අ./ස.අ (ශ්‍රී.ලං.ඉ.සේ.

ස.නි., ක.සේ.නි

ස.නි., ක.සේ.නි.

ස.නි., නා.නි (1), ක.සේ.නි.

ස.නි., ක.සේ.නි.

ස.නි., ක.සේ.නි

ස.නි., නා.නි. (1), ක.සේ.නි.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස.

කා.කා.ස

කා.කා.ස.

ඇමුණුම 1-3

2023.12.15 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මෙම පත්‍රිකාව ආයතනය විසින් ඇමුණුම - 01 හි දක්වා ඇති තොරතුරු වලට අනුකූල විය යුතුය.

1. අමාත්‍යාංශය / පළාත් සභාව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :
2.දෙපාර්තමේන්තුව / SOE නම / ආයතනය : නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

ඇමුණුම - 02

3.ලිපිනය : 12වන මහල . සෙත්සිරිපාය අදියර 2, බත්තරමුල්ල

4.අනුමත කාර්යමණ්ඩල තොරතුරු : 2024.09.30 - 2024.12.31

තනතුර	සේවය	පංතිය	වැටුප් කේතය	සේවා මට්ටම	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය			පවතින සේවක සංඛ්‍යාව				2024.09.30 සිට 2024.12.31 දක්වා කාලය සඳහා (ගණන)							
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැඩබලන/.....)	බඳවා ගැනීම්	බඳවා ගැනීම්	ද්විතීයික පදවියට මාරු	ඉල්ලා අස්වීම්	සේවය අකෘතාරාගම	සේවයෙන් පහකිරීම්	විශ්‍රාම යෑම්	මරණ
ලේකම්		විශේෂ	SL4	1	1			1											
අතිරේක ලේකම්	ශ්‍රී.ප.සේ.	විශේෂ	SL3	1	4			4										1	
අතිරේක ලේකම් #	ශ්‍රී.ක්‍ර.සේ.	විශේෂ	SL3	1	1			1											
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ඉ.සේ.	විශේෂ	SL3	1	4			1			2								
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ක්‍ර.සේ.	විශේෂ	SL3	1	2			2											
ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී.ග.සේ.	1	SL3	1	2			2											
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ප.සේ.	1	SL1	1	5			5											
ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ග.සේ.	1	SL1	1	4			4											
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ග.සේ.	1	SL1	1	3			2											
අධ්‍යක්ෂක	ශ්‍රී.ප.සේ.	1	SL1	1	5			5											
අධ්‍යක්ෂක	ශ්‍රී.ක්‍ර.සේ.	1	SL1	1	4			2			2								
අධ්‍යක්ෂක	ශ්‍රී.ඉ.සේ.	1	SL1	1	6			6											
සහකාර ලේකම්	ශ්‍රී.ප.සේ.	iii/ii	SL1	1	6			2											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ප.සේ.	iii/ii	SL1	1	3			1											
ගණකාධිකාරී	ශ්‍රී.ග.සේ.	iii/ii	SL1	1	4			1			1								
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ඉ.සේ.	iii/ii	SL1	1	8			6											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ක්‍ර.සේ.	iii/ii	SL1	1	8			7											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ක්‍ර.සේ (අධි සේවක)	iii/ii	SL1	1	3			3											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.තො.නා. සේ.	iii/ii	SL1	1	1			1											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	දෙපා.	iii/ii	SL1	1	1			1											
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ගෘ. සේ.	iii/ii	SL1	1	1			1											
අභ්‍යන්තර විගණක	ශ්‍රී.ග.සේ.	iii/ii	SL1	1	2			0											
ජාතික නිවාස කොමසාරිස්			SL1		1			0			1								

නීති නිලධාරී	දෙපා.	iii/ii	SL1	1	2			2											
පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ.	(අධි ශ්‍රේණි)	MN7	2	3			2											
ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් *	තාවකාලික				1					1									
පරිවර්තක	පරිවර්තක සේවාව	I/විශේෂ	MN-6	2	2			1											
නොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී.තොා.ස. තා.සේ.	2,ii/i	MN-6	2	3			2											
සංවර්ධන නිලධාරී	ස.නි.සේ.	iii/ii/i	MN4	3	307			265								1			
සංවර්ධන සහකාර	දෙපා.	iii/ii/i	MN4	3	1			1											
තාක්ෂණික නිලධාරී	ශ්‍රී.තා.සේ.	iii/ii/i	MN3	3	7			5											
රාජ්‍ය කළමනාකරණ සහකාර	රා.ක.ස.සේ.	iii/ii/i	MN2	3	75			62											
නොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.තොා.ස. තා.සේ.	3,iii/ii/i	MT1	3	2			2											
කළමනාකරණ සහකාර	දෙපා.	iii/ii/i	MN1	3	1			1											
ලිපිකරු	දෙපා.	iii/ii/i	MN1	3	2			2											
යතුරු ලියනය කරන්නා	දෙපා.	iii/ii/i	MN1	3	1			1											
පිළිගැනීමේ නිලධාරී	දෙපා.		MN1	3	1			1											
නිශ්චල ඡායාරූප ශිල්පියා	දෙපා.	iii/ii/i	MT 1	3	1			1											
වීඩියෝ කැමරා ක්‍රියාකරු	දෙපා.	iii/ii/i	MT 1	3	1			1											
කැමරා ක්‍රියාකරු සහායක		iii/ii/i	PL1	3	1			0											
රියදුරු	රියදුරු සේවය	ii/i/iii විශේෂ	PL3	4	50			40										1	
කාර්යාල සේවා සහයක	කා.සේ.සේ.	ii/i/iii විශේෂ	PL1	4	56			45											
කාර්යාල සේවා සහයක	දෙපාර්තමේන්තුගත	iii/ii/i	PL1	4	1			1											
එකතුව					**597**	**0**	**0**	**493**	**0**	**1**	**6**	0	0	0	0	1	0	2	0

ජනාධිපති ලේකම්තුමාගේ අංක PS/CSA/00/1/9/7 සහ 2022.06.10 දිනැති ලිපියට අනුවෙ රාජ්‍ය ලේකම්වරුන් අතිරේක ලේකම් ලෙස තනතුර දරණ පුද්ගලයින් මත පදනම්ව පත් කරනු ලබයි.
* ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් එක් (01) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරක් දරයි.

සේවා මට්ටම	**අනුමත සේවක සංඛ්‍යාව**	**පවතින සේවක සංඛ්‍යාව**
ජ්‍යෙෂ්ඨ	81	66
තෘතීයික	9	6
ද්විතීයික	399	342
ප්‍රාථමික	108	86
එකතුව	**597**	**500**

05. ඉහත තොරතුරු නිවැරදි බව මම සහතික කරමි.

6. ආයතන ප්‍රධානියාගේ නම සහ තනතුර : ලේකම්, රංජිත් ආරියරත්න
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය

7. සම්බන්ධීකරණ තොරතුරු : .....
සම්බන්ධීකරණ නිලධාරියා (නම) :එම්. ඒ. රණවක
තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
දුරකථන අංකය.

ඇමුණුම -03

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

Accounts Branch
02 JUN 2025
MINISTRY OF URBAN DEVELOPMENT, CONSTRUCTION AND HOUSING

මගේ අංකය எனது இல. My No. HUD/D/MUDC&H/FS/02/2024/76 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රමාණාත්මකතාවන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාව සඳහා සකස් කර ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයය අංක 123-2-7-29-2104/12 (නාගරික පුණර්ජීවන ව්‍යාපෘතියට සහාය වීමේ ව්‍යාපෘතිය) වෙනුවෙන් දරන ලද වියදම රු. 2,708,530 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ආ) යම් වර්ෂයක ප්‍රතිපාදිත මුදල් සීමාව ඉක්මවා ඇති අවස්ථාවක දී මු.රෙ. 66 මගින් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන සලසා ගතයුතු නමුත්, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2023 වර්ෂයේ දී වැයවිෂයයන් 04 ක සීමාව ඉක්මවා දරා තිබූ වියදම් සම්බන්ධයෙන් මු.රෙ. 69(2) ප්‍රකාරව කටයුතු කර 2023 වර්ෂය ඇතුළත ප්‍රතිපාදන සලසා ගැනීමට හෝ 2024 වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර මු.රෙ. 69 (1) අනුව මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 ට පෙර අධිකාරී බලය නොලබා ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දරා ඇත්තේ නම් එම වියදම් බැදීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ පෙන්නුම් කොට එම වැඩසටහනේ ප්‍රතිපාදන ඉක්මවා දරන ලද අධිකාරී බලය නොලත් වියදමක් ලෙස සැලකිය යුතු අතර එසේ ප්‍රතිපාදන ඉක්මවා කරන ලද වියදම් පියවීම සඳහා ඵළඹෙන ඊළඟ වර්ෂයේ එනම් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින නොඉක්මවා පාර්ලිමේන්තුවෙන් යෝජනාවක් සම්මත කරවාගත යුතුය. නමුත් ඒ අනුව කටයුතු නොකර ඉහත සඳහන් 2023 වර්ෂයේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා දරා තිබූ වියදම්, මුදල් රෙගුලාසි 66 වීරමොන් ක්‍රියාපටිපාටිය යටතේ වැය විෂය අංක 123-02-21-09-2104 - කොළඹ අගනගර ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට 2024 වර්ෂය සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදනවලින් රු. 1,454,898,300 ක් මාරු කර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය (BOS) අනුව, වර්ෂය තුළ වත්කම් මිල දී ගැනීම් රු. 10,950,454,158 ක් සහ වත්කම් පැවරීම් (transfer-in) රු.8,648,754,903 ක් ලෙස එකතුව රු. 19,599,209,061 ක් වුව ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූල්‍ය වත්කම් අත්පත් කරගැනීමේ වියදම රු. 20,107,336,777 ක් ලෙස දැක්වීමෙන් රු. 557,673,557 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ඉඩම් හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංසථාව (SLLDC) විසින් 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ඔලියමුල්ල හා කොලොන්නාව යන ජලය පිරිපහදු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘති

සඳහා අමාත්‍යාංශය විසින් 2023 හා 2024 වර්ෂවල දරන ලද පිළිවෙලින් රු. 697,066,800 හා රු. 1,187,278,827 වටිනාකමක් පමණක් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ කෙරිගෙන යන වැඩ යටතේ ඇතුළත් කර තිබුණි. නමුත් එම ව්‍යාපෘති සඳහා රජය විසින් දරන ලද මුළු පිරිවැය වත්කම් වාර්තාව තුළ ඇතුළත් නොවන බැවින් එම වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම්

හොරණ පොළ (අදියර 4) ව්‍යාපෘතිය සඳහා 2024 පෙබරවාරි 05 දින ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් වන රු. 1,751,382 ක වටිනාකම 2024 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් අඩුකරගෙන තිබුණි. නමුත් එම වටිනාකම කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය සහ සංචිත ගිණුම් ප්‍රකාශය තුළ 2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකළ යුතු ශේෂයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂය රු. 1,751,382 ක් වැඩියෙන් දැක්වුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙනුවෙන් අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම(2104) යටතේ මු.රෙ. 208 මගින් දරන ලද රු. 15,628,182,967ක් අමාත්‍යාංශ වැය ශීර්ෂයට හර කර තිබුණි. එම වටිනාකම අමාත්‍යාංශයේ සමස්ථ වියදම්වන් සියයට 41 ක් විය. නමුත් එම වියදම් සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තා මගින් එම වියදම් සන්නිරීක්ෂණය කළ නොහැකි වූ අතර එමගින් ජනිත වූ වත්කම් හඳුනාගැනීමටද නොහැකි විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව, 2024 ජනවාරි 01 දිනට ආරම්භක වත්කම් ශේෂයට රු.125,856,931,000 ක වත්කම් එකතු කර තිබුණු අතර රු. 8,648,754,903 ක වත්කම් මාරු කර තිබුණි. නමුත් එම වත්කම් වටිනාකම්වල නිවැරදිභාවය විගණනයේ දී තහවුරු කරගත නොහැකි විය.

(ඇ) වත්කම් වර්ග 03 ක් යටතේ වර්ෂය තුළ එකතු කරන ලද රු. 27,242,202,743 ක වත්කම් සම්පූර්ණයෙන්ම සහ තවත් වත්කම් වර්ග 08 කට අයත් රු. 15,800,929,096 ක වත්කම් ප්‍රමාණයක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත්කර තිබුණි. නමුත් එම වත්කම්වල වටිනාකම්හි නිවැරදිභාවය විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු. 47,427,178,360 ක් සනාථ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද CIGAS වත්කම් ලැයිස්තුව තහවුරු කර ගැනීම සඳහා එක් එක් අංශය විසින් නඩත්තු කරන වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ඊ) මුදල් රෙගුලාසි අංක 214 ප්‍රකාරව, මුදල් නිබෙන බවට හා නිතිපතා මුදල් ලැබෙන බවට සහතික වීම පිණිස බැරකම් පිළිබඳ ලේඛන පවත්වා ගතයුතු වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය මඟින් වැය විෂයයන් 4 ක් යටතේ ඉදිරිපත්කර තිබුණු රු. 50,005,896 ක් වටිනා බැඳීම් හා බැරකම් සඳහා බැරකම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් ඉදිරිපත්කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	නිර්දේශය	ක්‍රියාත්මක කර නොතිබුණු මෙම වාර්තාවේ ඡේද යොමුව
2.1	මුදල් රෙගුලාසි අංක 50 (ii)සිට (iv) රෙගුලාසිවලට පටහැනිව අධි සහ ඌන ප්‍රතිපාදන සිදුකිරීම	3.2

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

වැය විෂයයන් සඳහා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන මාරු කර ගැනීමේ දී ඒවා 2024 නොවැම්බර් 30 දිනට පෙර මාරු කරගත යුතු වුව ද, 123-2-21-14-2509 (කොළඹ හා උප නගර ආශ්‍රිත ජල පොම්පාගාර පවත්වාගැනීම හා නඩත්තුව) සහ 123-2-21-15-2509 (හදිසි ගංවතුර තත්වයනට සූදානම් වීම) යන වැය විෂයයන් 02 සඳහා මු.රෙ. 66 මඟින් රු. 119,123,412 ක ප්‍රතිපාදන 2024 දෙසැම්බර් 31 දින මාරු කරගෙන තිබුණි. එබැවින් අක්මුදල් නොලැබීම නිසා මාරු කරගත් මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි වී තිබුණි.

3.2 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 50 (ii) සිට (iv) දක්වා ඇතුළත් රෙගුලාසිවලට පටහැනිව අධි සහ ඌන ප්‍රතිපාදන සිදුකළ අවස්ථා පහත දැක්වේ.

(අ) අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කරගත් පුනරාවර්තන වැය විෂයන් 02 ක් වෙත ප්‍රතිපාදිත මුදල් එකතුව රු. 4,800,000 ක් සහ ප්‍රාග්ධන වැයවිෂයන් 11 ක් සඳහා ප්‍රතිපාදිත මුදල් එකතුව රු. 3,033,000,000 ක් වූ ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන්ම (100%) ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්ථන වැය විෂයයන් 27 ක් යටතේ ප්‍රතිපාදිත රු. 706,336,000 කින් රු. 296,340,214 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 34 ක් යටතේ ප්‍රතිපාදිත රු. 36,443,261,788 කින් රු.11,076,231,282 ක් ලෙස එකතුව රු. 11,372,571,496 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 10 සිට සියයට 99 අතර පරාසයක පැවතුණි.

(ඇ) අවශ්‍යතාවය හඳුනාගැනීම්කින් තොරව, ප්‍රතිපාදන වෙන්කර ගැනීම් හේතුවෙන් වැය විෂයයන් 04 ක් වෙත ප්‍රතිපාදිත රු. 46,100,000 ක මුළු ප්‍රතිපාදනයම ද තවත් වැය විෂයයන් 06 ක් වෙත ප්‍රතිපාදිත මුදලින් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක ප්‍රතිපාදන ද මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ඈ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් නොකළ වැය විෂයයන් 11 ක් වෙත පසුව මු.රෙ. 66 යටතේ රු. 1,836,398,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.

(ඉ) වැය විෂයයන් 04 ක් වෙත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදිත රු.1,008,500,000 ක මුදල ප්‍රමාණවත් නොවීම නිසා එම වැය විෂයයන් 04 වෙත ප්‍රතිපාදිත මුදලටත් වඩා වැඩි ප්‍රතිශතයක් එනම් රු. 1,014,174,500 ක මුදලක් මු.රෙ. 66 මඟින් මාරු කරගෙන තිබුණි.

3.3 වියදම් අතිරික්තය/ අධිවැය

2024 මහ මැතිවරණ රාජකාරීවල නිරත වූ අමාත්‍යාංශ නිලධාරීන්ට ගෙවන ලද රු. 1,092,609 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ද මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කර නොතිබුණු බැවින් අග්‍රිම ගිණුමේ රු. 1,092,609 ක නොපියවූ ශේෂයක් පැවතුණි.

3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර නොගත යුතු අතර ඉදිරියේ දී ප්‍රතිපාදන ලබාගැනීමේ අපේක්ෂාවෙන් කිසිදු බැඳීමක් ඇතිකර නොගත යුතුය. නමුත් අමාත්‍යාංශය විසින් වැය විෂයය 03 ක් සඳහා ප්‍රතිපාදිත රු. 236,300,000 ක මුදල ඉක්මවා එකතුව රු. 20,620,363 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.

(ආ) 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන ඉක්මාව වැය දැරීම සඳහා බැඳීම් ඇතිකර නොගත යුතු අතර ඉදිරියේ දී ප්‍රතිපාදන ලබාගැනීමේ අපේක්ෂාවෙන් කිසිදු බැඳීමක් ඇතිකර නොගත යුතුය. තව ද ප්‍රතිපාදන ඉක්මවා ඇතිකර ගනු ලබන බැඳීම් සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්. දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී පෞද්ගලිකවම වගකිව යුතුයි. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අවසන් ගිණුමට අනුව වැය විෂයය අංක 123-02-21-03-2105 සහ 123-21-04-2506 වැය විෂයයන් 2 යටතේ රු. 1,212,215,504 ක් බැරකම් දක්වා තිබුණ ද අමාත්‍යාංශයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ එම වටිනාකම් දක්වා නොතිබුණි.
මීට අමතරව අමාත්‍යාංශය විසින් තවත් වැය විෂයයන් 09 ක් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඇතිකරගෙන තිබුණු එකතුව රු. 312,029,279 ක් වටිනා බැරකම් පිළිබඳ විස්තරද මූල්‍ය ප්‍රකාශනයේ දෙසැම්බර් 31 දිනට "බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ" ඇතුළත්කර නොතිබුණි.

(ඇ) මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රකාශනය අනුව, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශ වැය ශීර්ෂයට අදාළ මුළු බැඳීම් හා බැරකම් ශේෂය රු. 1,044,588,314 ක් වුව ද, අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ ශේෂවල එකතුව රු. 1,094,570,610 ක් විය. රු. 49,982,296 ක වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, අමාත්‍යාංශය විසින් විගණන විමසුම් 09 ක් සඳහා පිළිතුරු මේ දක්වා ලබා දී නොතිබුණි.

3.6 අවසිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය සතු KL – 9507 දරන වාහනයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියාව සඳහා, වාහනයේ නියෝජිත ආයතනය වෙත 2021 වර්ෂයේ දී යොමුකර තිබුණු අතර අලුත්වැඩියා කටයුතු අවසන්කර එම ආයතනය විසින් 2023 සැප්තැම්බර් 27 දින ඉන්වොයිසියක් නිකුත් කර තිබුණු නමුත් අදාළ වියදම 2023 වර්ෂයේ සිදුකර නොතිබුණු අතර 2024 මාර්තු 13 දින එම ආයතනය විසින් නැවත ඉදිරිපත් කළ ඉන්වොයිසිය සඳහා අමාත්‍යාංශය විසින් ගෙවීම් කර තිබුණි. 2021 වර්ෂය තුළ දී ඇතිකරගන්නා ලද බැඳීමක් හා 2023 වර්ෂයේ දී සිදු කරන ලද අලුත්වැඩියාවක් වෙනුවෙන් මු.රෙ. 115 අනුමැතියකින් කොරව 2024 ජූනි 24 දින රු. 2,503,144 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) අනුරාධපුර මහවිලච්චිය පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මඟින් ඉදිකරන ලද නිවාස හා අනෙකුත් ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ එකතුව රු. 4,697,760 ක විවලනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව, ස්ථාවර තාක්ෂණික කමිටුවේ(STC) පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර ඉහත කී විෂය පථය වෙනස්කිරීම් සඳහා ද නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත සිදුකරනු ලැබූ කාර්යයන් සඳහා නව රේටයන් හා ඒ මත සියයට 17 ක ගාස්තුවත් සමඟ සැකසූ බිල්පත් මත ගෙවූ මුදල රු.මිලියන 3,768 ක් වූ අතර එම වැඩවල පිරිවැය රු.මිලියන 1,632 ක් වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත සිදුකරනු ලැබූ කාර්යයන් වලින් සියයට 131 ක අධිප්‍රාමාණික ලාභයක් ඉපයීමට කටයුතු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යයභාරයන් ඉටු නොකිරීම

2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර එතැන් පටන් 2024 දෙසැම්බර් 31 දින දක්වා උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 08 ක නිවාස 36,736 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 29,813 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට පෙර වැඩ ආරම්භ කරන ලද වහල මට්ටම දක්වා වැඩ නිම කළ නිවාස 102 ක, බිත්ති මට්ටම දක්වා වැඩ නිම කළ නිවාස 12 ක හා අත්තිවාරම පමණක් යෙදූ එක් නිවසක වැඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැඩ ආරම්භ කරන ලද නිවාස 207 ක වැඩ වර්ෂය අවසානය දක්වාම නිමකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට යුද්ධය නිම වී වසර 15 ක් ගත වී තිබුණ ද, යුද්ධයෙන් අවතැන්වූවන් තවදුරටත් හඳුනාගනිමින් පවතින අතර ප්‍රතිලාභීන් තෝරාගැනීමේ විනිවිධභාවයක් විගණනයට නිරීක්ෂණය නොවුණු අතර නැවත පදිංචි කිරීමේ කටයුතු ද නිම වී නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් බලපෑමට පත් වූ පවුල් සඳහා නව තාක්ෂණ, ආර්ථිකමය ලාභදායී කොන්ක්‍රීට් පැනල් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 පෙබරවාරි 20 දින ආරම්භ කර 2020 අගෝස්තු 12 දින නිම කළ යුතු වුව ද, 2022 නොවැම්බර් 30 දින දක්වා අවස්ථා 04 ක දී කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණ ද මෙම ව්‍යාපෘතිය නිසියාකාරව ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් 2023 පෙබරවාරි 15 දින කොන්ත්‍රාත් ගිවිසුම අවසන්කර රු. 19,200,000 ක් වූ කාර්යසාධන සුරක්ෂණය, මුදල්

කරගෙන පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ 15.2 (C) වගන්තිය ප්‍රකාරව කාර්ය සාධනය දුර්වල වීම මත මුදල් කරනු ලැබූ මෙම මුදලින් දෝෂ නිවැරදි කිරීමෙන් පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැරකල යුතුව තිබුණු අතර 15.4 වගන්තිය ප්‍රකාරව අඩුපාඩු සම්පූර්ණ කිරීම වැඩ නිමකිරීමේ ප්‍රමාදය මත සිදු වූ පාඩුව සහ දරන ලද අනෙකුත් වියදම් පියවා ගැනීමට අවශ්‍ය මුදල් රඳවා ගත යුතුව තිබුණි. නමුත් එම මුදල් රඳවා ගැනීමකින් තොරව 2024 මැයි 31 දින එම මුදලින් රු. 9,178,025 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ආපසු ගෙවා තිබුණි.

(ආ) එකඟ වූ පරිදි නිවාස 300 ම ඉදිකර මේ වෙනතෙක්ම භාර නොදී ගිවිසුමේ කොන්දේසි කඩකිරීම වෙනුවෙන් ගිවිසුමෙහි 8.7 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද දඩ (Liquidated damages) අයකිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) මු.රෙ. 705(ආ) ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සතුටුදායක අන්දමින් ඉටුකිරීමට අපොහොසත් වන කොන්ත්‍රාකරුවන් සම්බන්ධයෙන් යුතුකම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛණයට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වුව ද, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පියවර ගෙන නොතිබුණි.

(ඈ) අඩක් නිමකල නිවාසයන්හි බිත්ති අවරශ්මියට ඔරොත්තු නොදීම හේතුවෙන් ඇද වී තිබුණු අයුරුත්, නිවාස ඇතුළත තිබුණු ප්‍රමිතියෙන් තොර අනෙකුත් උපාංග ද අලුතෙන් දමා ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමේ පැවති බවත් 2024 දෙසැම්බර් 12 දින කුවවෙලි ප්‍රදේශයේ ඉදිකර ඇති නිවාස සම්බන්ධයෙන් කරනු ලැබූ භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. එමෙන්ම පවත්නා අත්තිවාරමහි නිවාස ඉදිකර ගැනීමට අකැමැති ඉඩම් හිමියන් 18 ක් සිටි අතර රු. 6,220,800 ක් වැයකර දමා තිබූ අත්තිවාරම්වල නිවාස ඉදි නොකිරීම හේතුවෙන් වසර කීපයක් තිස්සේම වල්බිහිවී තිබුණු බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

4.1.3.1 ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 33,237.76 ක් වූ කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 29 දින ආරම්භ කර 2019 ජූනි 30 වන විට අවසන් කිරීමට ද පැකේජ 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණ ධුරාවලිය අනුව මූලිකත්වය දිය යුතු ක්‍රමවේදයන්ට අවධානය යොමු නොකර ජාතික

ප්‍රතිපත්තිය මඟින් හඳුනාගෙන තිබූ අවසන් ක්‍රමවේදය වන කසළ රඳවනයක් තුළ තැන්පත් කිරීමේ ක්‍රමවේදයට මූලිකත්වය ලබා දී තිබුණි.

(ආ) කිසිදු ඵල ප්‍රයෝජනයක් නොමැති ඝන අපද්‍රව්‍ය තුළින් වාර්ෂිකව කිලෝවොට් පැය 70,000,000 ක බලශක්තියක් උත්පාදනයකර ජාතික විදුලිබල පද්ධතියට එකතු වීම පිලිබඳ කිසිදු තැකීමක් නොකර තාවකාලික කසළ රඳවනයක කසළ තැන්පත් කිරීම තුළින් රජයට සිදුවන මූල්‍යමය ලාභය පිලිබඳව පමණක් අවධානය යොමු කිරීම මතභේදාත්මක විය.

(ඇ) එම ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථානය (A), සනීපාරක්ෂක බිම් පිරවුම (B) සහ දුම්රිය මාර්ග දිර්ඝ කිරීම(C) යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු රු. මිලියන 25,577.95 (ඇ.ඩො.100,957,546.14) ක වටිනාකමට වීන සමාගමක් වෙත පවරා තිබුණු අතර එම සමාගම තෝරාගත් ක්‍රමවේදය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ලෝක බැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව විනිවිදභාවයකින් සිදුකර නොමැති බැවින් ලෝක බැංකු මගපෙන්වීම යටතේ නැවත ලංසු කැඳවන ලෙස ලෝක බැංකුව විසින් අවධාරණය කර තිබුණ ද, අදාළ ටෙන්ඩරය අවලංගු කිරීමට අමාත්‍යාංශයට නොහැකි වීම නිසා ලෝක බැංකු අධාර යටතේ වඩාත් පුළුල් ක්ෂේත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව තිබුණු මෙම ව්‍යාපෘතියේ වැයබර ශ්‍රී ලංකා රජයට දැරීමට සිදුව තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ කසළ හුවමාරු මධ්‍යස්ථාන, සනීපාරක්ෂක බිම් පිරවුම සහ දුම්රිය මාර්ග දිර්ඝ කිරීම යන පැකේජ 03 හි ඉදිකිරීම් කටයුතු පැවරුණු වීන සමාගමේ ප්‍රමාදය නිසා වරින් වර දින දිර්ඝ කිරීම් ලබා දී තිබුණු අතර 2024 සැප්තැම්බර් 30 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් මෙම ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 31 වන විට ද අවසන් කර නොතිබුණු අතර එහි භෞතික කාර්යසාධනය සියයට 98.2 ක් සහ මූල්‍ය කාර්යසාධනය රු.මිලියන 21,336.49 ක් විය.

(ඉ) අවශ්‍ය කරන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ පැකේජය(D) සඳහා රු. මිලියන 2,963.61 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එමගින් දුම්රිය එන්ජින් කට්ටල 04 ක් රු.මි. 8.27ක් වැයකර 2019 දෙසැම්බර් 31 වන විට ආනයනය කර දුම්රිය දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ලබා දී තිබුණු අතර බහාලුම් පෙට්ටි 94 ක් ඇ.ඩො.මි. 0.8 ක් වැයකර 2022 අප්‍රේල් 22 දින ආනයනය කර ගබඩා කර තිබුණි. දුම්රිය වැගන් 34 ක් ඇ.ඩො.මි. 2.3 ක වටිනාකමකට ඉන්දියන් සමාගමකින් ආනයනය කරගැනීම සඳහා 2019 ඔක්තෝබර් 21 දින ගිවිසුම් අත්සන්කර තිබුණ ද අදාළ ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව ව්‍යුහාත්මක සංකල්පීය සැලැස්ම ඉදිරිපත් නොකිරීම නිසා ගිවිසුම නිෂ්ක්‍රියකර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂාවසානය වන විට ද දුම්රිය වැගන් සපයාගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුව ද 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම පැකේජය සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 2,024.21 ක් වැයකර ලබාගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 95 ක් විය.

(ඊ) 2024 දෙසැම්බර් 31 වන විට අමත්‍යාංශය විසින් මෙම සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 25,976.27 ක් වැයකර තිබුණ ද ව්‍යාපෘතියේ කටයුතු අවසන් වී නොමැති බැවින් ව්‍යාපෘතිය සක්‍රිය කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී පහත කරුණු ද නිරීක්ෂණය විය.

(i) කසළ පැටවුම් මධ්‍යස්ථානය වෙත ගෙන එනු ලබන කසළ දුම්රිය අංගනය වෙත ප්‍රවාහනය කිරීම හා අරුවක්කාලු කසළ මධ්‍යස්ථානයේ සිට කසළ බිම්පිරවුම වෙත ප්‍රවාහනය කිරීම හා අනෙකුත් කාර්යයන් සඳහා ඇ.ඩො. 8,272,911 ක වටිනාකමැති වාහන 44ක් කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගෙන කසළ හුවමාරු මධ්‍යස්ථානවල වාහන අංගන තුළ ගාල්කර තිබුණි. එම වාහන 2019 වර්ෂයේ මෙරටට ගෙන්වා තිබුණු අතර කොන්ත්‍රාත්තුව අවසන්කර හාරදෙන තෙක් එම වාහන වසර 05 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පවතින බව ද එබැවින් මෙම වාහන අක්‍රිය තත්වයට පත්ව තිබුණ අතර වගකීම් කාලය ද ඉක්මවා ගොස් තිබුණු බැවින් ඒවා නැවත සක්‍රීය තත්වයට පත්කිරීමට අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(ii) අරුවක්කාලු සනීපාරක්ෂක බිම් පිරවුමේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පෙර රජය විසින් ගත් ක්ෂණික තීරණයක් නිසා 2019 අගෝස්තු සිට 2020 දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ නාගරික ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 50,000 ක් පමණ තැන්පත් කර තිබූ අතර එම කසළ මඟින් ජනනය වූ අපදියර පිරිපහදු කිරීම සඳහා ඇ.ඩො.1,129,989.12 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(iii) ශ්‍රී ලංකාවේ දැනට ඝන අපද්‍රව්‍ය වලින් බලශක්තිය නිපදවීමේ බලාගාරයක් කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකර ක්‍රියාත්මක වන අතර එහි ඉතිරිවන විහිදුම් අළු (Fly Ash) හා බිම් අළු (Bottom Ash) විශාල වශයෙන් එක්රැස් වුව ද බැහැර කිරීම සඳහා අරුවක්කාලු කසළ රඳවනාගේ පහසුකම් සලසා නොතිබුණි.

(iv) අරුවක්කාලු කසළ රැඳවුම් අංගනයේ බාහිරින් එක්රැස් වන වැසි ජලය බැහැර කිරීම සඳහා කාණු පද්ධතියක් ඉදිකර නොතිබුණු බැවින් 2021 නොවැම්බර් 09 දින ගංවතුර හේතුවෙන් අරුවක්කාලු කසළ අංගනය ගංවතුරෙන් යටවීම නිසා අපදියර ප්‍රතිකර්ම මධ්‍යස්ථානයේ හා අපවායු ප්‍රතිකර්ම මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලද යන්ත්‍රෝපකරණ අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි.

4.1.3.2 පලාත් 9 සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 180,636,714 ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකු වෙත පවරා අදියර 3 කින් 2018-2024 කාලසීමාව තුළ ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු වෙළඳසංකීර්ණ ගොඩනැගිල්ල මූලික අදියරේ දී මහල් 3 කින් සමන්විතව ඉදිකිරීමට අපේක්ෂිතව පැවතිය ද එය අදියර 3 ක් යටතේ සිදුකිරීම විගණනයේ දී මතභේදාත්මක විය.

(ආ) රු. 88,956,707 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත මෙහි පළමු අදියර 2018 සැප්තැම්බර් 25 දින ආරම්භ කර 2019 අප්‍රේල් 22 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද එය 2019 දෙසැම්බර් 28 දින දක්වා දින දීර්ඝ කර තිබුණි. එසේ වුව ද දින 556 ක කාල ප්‍රමාදයකින් පසුව 2021 ජූලි 08 දින වැඩ අවසන් කිරීම නිසා ප්‍රමාද දඩ වශයෙන් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක්, එනම් රු. 8,895,670 ක වටිනාකමක් 2021 දෙසැම්බර් 02 දින කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඊට එරෙහිව ආරවුල් බෙරුම්කරණ මණ්ඩලයට(DAB) පැමිණිල්ලක් යොමුකර තිබුණු අතර, උපදේශක ඉංජිනේරු විසින් අනුමත කර තිබුණු දින දීර්ඝ කිරීම් සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා නොදීම සහ අනුමැතිය ලබා නොදීම සාධාරණීකරනය කිරීමට හේතු ආරවුල් බෙරුම්කිරීමේ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 16,931,607 ක වටිනාකමක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට ආරවුල් බෙරුම්කරණ මණ්ඩලය විසින් නිර්දේශකර තිබුණි. පසුව දෙපාර්ශවයේ එකඟතාව මත රු.12,860,501ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) පළමු අදියරේ ඉතිරි වැඩ රු. 73,714,237 ක කොන්ත්‍රාත් වටිනාකමකට ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ දෙවන අදියර 2021 ජුනි 22 දින ආරම්භ කර 2021 දෙසැම්බර් 19 දින අවසන් කර තිබුණු අතර ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සියලු වැඩ නිම කිරීමකින් තොරව අඩුපාඩු සහිතව 2022 අප්‍රේල් 01 දින මිනුවන්ගොඩ නගර සභාව වෙත භාර දී තිබුණු බැවින් මෙම ගොඩනැගිල්ල ජනතා අයිතියට පත්කර ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. ඒ අනුව එම ගොඩනැගිල්ල ජනතා අයිතියට පත්කිරීම සඳහා කඩ කාමර වලට අකුලන දොරවල් 21 යෙදීම, ජල පහසුකම ලබා ගැනීම, විදුලි පහසුකම ලබා ගැනීම, කාණු පද්ධතිය හා ගොඩනැගිල්ල ආශ්‍රිත භූමිය සංවර්ධනය කිරීම සඳහා රු. 28,637,660 ක් පමණ අමතරව නගරසභා අරමුදලින් වැයකිරීමට සිදු වී තිබුණි.

(ඈ) අදියර 3 යටතේ ගොඩනැගිල්ල සඳහා විදුලි සෝපානයක් සවිකිරීම හා අබාධිත වැසිකිලිය ඉදිකිරීම සඳහා රු. 17,965,170 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු අතර කොන්ත්‍රාත්තුව 2023 දෙසැම්බර් 21 දින ආරම්භ කර 2024 ජූලි 6 දින අවසන් කළ යුතු වුව ද දින 86 ක ප්‍රමාදයකින් 2024 සැප්තැම්බර් 30 දින අවසන් කර තිබූ නමුත් දින දීර්ඝ කිරීම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණු බැවින් ගිවිසුමේ කොන්දේසි අංක 49.1 ප්‍රකාරව ප්‍රමාද දඩ ලෙස රු. 903,000 ක් කොන්ත්‍රාත්කරුගෙන් අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. තව ද රු.9,613,300 (වැට් රහිත) ක් වැයකර 2024 සැප්තැම්බර් 30 දින වැඩ අවසන් කරන ලද විදුලි සෝපානය ප්‍රයෝජනයට නොගෙන මේ දක්වා නිශ්කාර්යව පැවතුණි.

(ඉ) ප්‍රදේශයේ මහජනතාවගේ අවශ්‍යතාවන් ඉටුවන ආකාරයෙන් සැලසුම් සකස් කිරීමකින් තොරව, මිනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමට කටයුතු කර තිබුණු බැවින් රු. මිලියන 180 ක් පමණ වැයකර ඉදිකරන ලද මෙම වෙළඳ සංකීර්ණය වෙත වැයකළ මුදලට සරිලන ඵලදායිතාවක් ලබාගත නොහැකි වී තිබුණි.

4.1.3.3 පලාත් 09 සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත, සීතාවකපුර නගර සභාව සඳහා දෙමහල් පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. ව්‍යාපෘතියේ මූලික සැලසුම අනුව, කඩකාමර 26 කින් යුතු උඩුමහලකින් සහ වාහන නැවැත්වීමේ පහසුකම් සහ කුලී පදනම මත ලබා දිය හැකි ශාලා සහිත බිම් මහලකින් සමන්විත මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු. 119,715,026 (බදු රහිත)ක කොන්ත්‍රාත් වටිනාකමකට පුද්ගලික සමාගමක් වෙත 2021 ජූලි 15 දින පවරා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2021 අගෝස්තු 01 දින ආරම්භ කර 2022 අගෝස්තු 01 දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2024 මාර්තු 31 දින දක්වා දින දීර්ඝ කිරීම් 06 ක් ලබාදී තිබුණි. 2022 දෙසැම්බර් 21 දිනැති අංක MF1/1/CI/3/PR12 දරන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව මෙම ව්‍යාපෘතියේ විෂයපථය අඩුකර කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 102 ක වටිනාකමකට සංශෝධනය කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් සමාගමට අමාත්‍යාංශය විසින් රු. 113,114,825 ක් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ නිම කර 2024 අප්‍රේල් 10 දින අවිස්සාවෙල්ල නගර සභාව වෙත භාරදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවිස්සාවෙල්ල නගර සභාවේ අවශ්‍යතාව, කඩකාමර 26 කින් යුතු උඩුමහලකින් සහ වාහන නැවැත්වීමේ පහසුකම් සහ කුලී පදනම මත ලබා දිය හැකි ශාලා සහිත බිම් මහලකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම වුව ද පසුව 2022 වර්ෂයේ දී අදාළ විෂයපථය සීමා කිරීම් නිසා උඩු මහලේ ස්ථාපිත කිරීමට නියමිතව පැවති කඩකාමර 26 ද බිම් මහලේ ඉදිකිරීමට සිදු වීම හේතුවෙන් කඩ කාමරවල ප්‍රමාණය කුඩා වීමත්, කඩකාමර නියමිත පරිදි වෙළඳාම් කටයුතු පහසුවෙන් කරගත හැකි ලෙසට ස්ථාපිත නොකිරීමත් හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව වෙත භාරදී මාස 07ක් ගතවී තිබුණ ද කඩ හිමියන් විසින් කඩ කුලියට ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) රු. මිලියන 102 ක් වූ සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා අවස්ථා 4 ක දී විවලන නියෝග අනුමත කර තිබුණු අතර තවත් රු. 23,623,154 ක් ගෙවිය යුතුව තිබුණි. එය සංශෝධිත ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු. 34,737,979 ක එනම් සියයට 34 ක

විවලනයකි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 අනුව විවලනයන්ගේ සාමාන්‍ය ප්‍රමාණය හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවන්නේ නම් ප්‍රධාන ගිණුම් නිලධාරියාගෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

4.1.3.4 අමාත්‍යාංශය විසින් රු.මිලියන 400 ක් වැයකර ඉදිකරන ලද මහර පරිපාලන හා වාණිජ සංකීර්ණ ගොඩනැගිල්ල අදාළ පාර්ශවයනට භාරදීමට කටයුතු නොකිරීම නිසා 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා වසර 6 ක් නිශ්කාර්යව පැවතුණි. අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

4.1.3.5 2020 දෙසැම්බර් 22 දිනැති අංක අමප/20/1803/306/051 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, කොටගල තෙත්බිම් උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය අදියර - 01 පොකුණ හා බැම්ම ඉදිකිරීම හා අදියර - 02 පොකුණ වටා සංවර්ධන කටයුතු වශයෙන් වටිනාකම රු. 49,596,970 ක් වූ කොන්ත්‍රාත් 2 ක් ලෙස හඳුනාගෙන ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු රු. 75,663,466 ක වැඩ අවසන් වටිනාකමක් මත අවසන් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තෙත්බිමක් ලෙස සංවර්ධනය කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පවරාගෙන නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණු හෙක්ටයාර් 12 ක ඉඩමෙන්, තෙත්බිම් උද්‍යානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 05 ක පමණ කොටසක් යොදාගෙන තිබුණු අතර අවශ්‍යතාව නියමිත පරිදි හඳුනාගැනීමකින් තොරව ඉඩම් අත්පත්කර ගැනීම හේතුවෙන් ඉතිරි හෙක්ටයාර් 07 වසර 04 ක පමණ කාලයක් තිස්සේ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යයව පැවතුණි.

(ආ) ඉහත අත්පත් කර ගත් ඉඩම් හිමිකරුවන්ට වන්දි ගෙවීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වනවිට ද සිදුකර නොතිබුණු අතර සංවර්ධන කටයුතු සිදු නොකළ ඉතිරි භූමි ප්‍රමාණය ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 39 (අ)1 අතුරු විධානය පරිදි පැරණි ඉඩම් හිමිකරුවන්ට අවසතු කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) චර්ග මීටර් 15,572.19 ක වපසරියක් සහිත පොකුණ සංවර්ධනය කිරීම සඳහා රු.7,007,485 ක් හා ඇවිදීමේ මංතීරුව සකස් කිරීම සඳහා රු. 25,861,570 ක් වැයකර තිබුණද ඒවායේ කිසිදු නඩත්තු කටයුත්තක් සිදු නොකර අතහැර දමා තිබීමෙන් අපේක්ෂිත අරමුණු ලභාකර ගැනීමට නොහැකිවී තිබුණු අතර දරන ලද මුලු වියදම වන රු. 32,869,055 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඇ) ඇස්තමේන්තුගත ප්‍රමාණ පත්‍රය(BOQ) අනුව, පොකුණ වටා ඇවිදින මංතීරුවේ සෝලා විදුලි පහන් කණු සවිකිරීම සඳහා රු. 7,500,000 ක් වෙන්කර තිබුන ද රු. 6,376,199 ක් වැය කර 24w LED වීදි පහන් කණු 40 ක් සහ මීටර් මැදිරියක් (Meter room) ස්ථාපිත කර තිබුණි. නමුත් විගණිත දිනය වන විට ද එම පරිශ්‍රය වෙත විදුලි පහසුකම ලබාගෙන නොතිබුණු අතර ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු වැඩපිළිවෙලක් යොදා නොතිබුණු බැවින් විදුලි පහන් සහ ස්විච සියල්ලම කිසියම පිරිසක් විසින් ගලවාගෙන ගොස් තිබුණු බව භෞතික විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

4.1.3.6 ඇස්තමේන්තුගත වියදම රු. 238,092,085 ක් මත ඉදිකරන ලද බෙලිඅත්ත අම්පිටිය වැව ඇවිදින මංතීරුව හා භූ දර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණු නමුත් ව්‍යාපෘතිය භාරදීමෙන් පසු නඩත්තු කටයුතු සිදුනොකිරීම නිසා ව්‍යාපෘති භූමිය වල් බිහි වී පාරිසරික ගැටලු රැසක් ඇතිවී තිබුණි. ඒ අනුව රු. 65,773,152 ක් වැයකර සිදු කරන ලද උක්ත ව්‍යාපෘතිය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යයව පවතින බව නිරීක්ෂණය විය.

4.1.3.7 පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතියට අදාළව ග්‍රාමීය ජල පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2021 දෙසැම්බර් 27 දින රු. 56,159,319.06 ක (වැට් සහිත) මුදලකට පිරිනමා තිබුණි. පසුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නැවත විෂය පථය අඩුකර රු. 61,671,972 ක (වැට් සහිත) සංශෝධිත ඇස්තමේන්තුවක් 2022 අගෝස්තු 24 දින ඉදිරිපත්කර තිබුණි. උක්ත ව්‍යාපෘතිය වර්ෂයක් තුළ නිම කළ යුතු වුව ද, කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා, කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය, කොන්ත්‍රාත් උපදේශන ආයතනයන්හි සමීප හා ප්‍රමාණවත් අධීක්ෂණය නොමැති වීම නිසා ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 ක් ඉක්මවා තිබුණ ද විගණිත දින වන විටත් ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ඉලක්කගත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) "උපකල්පනයක්" පදනම් කරගෙන ඇස්තමේන්තුව පිළියෙල කිරීම නිසා ඇස්තමේන්තුවට සිදුකරන ලද අතිරේකයක්/ සංශෝධනයක් ලෙස නැවත 2021 දෙසැම්බර් 31 දින රු. 5,512,653 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණ අතර ප්‍රමාණ බිල්පත් සකස් කිරීමට පෙර වැඩබිම් වෙත ගොස් අධීක්ෂණය කර නිවැරදි ප්‍රමාණ මිණුම් ලබා නොගැනීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලබා දීම වෙනුවට ඇස්තමේන්තුගත මුළු මුදල වන රු. 56,159,319 ක් 2021 දෙසැම්බර් 27 දින ගෙවා තිබුණ ද, ඊට මාස 08 කට පසු, එනම් 2022 අගෝස්තු 10 දින ව්‍යාපෘතියට අදාල

සිවිල් කටයුතු ආරම්භකර තිබුණි. මේ අනුව අමාත්‍යාංශයට වෙන්කරන ලද ප්‍රතිපාදනයන් අපේක්ෂිත වැඩ ඉටුකර ගැනීමට පෙර වෙනත් ආයතනයක වසර 03 කට වැඩි කාලයක් තිස්සේ රඳවා තබාගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ විෂය පථය නිවාස 153 සිට 135 දක්වා නිවාස 18 කින් අඩුකර තිබුණ ද ජල සැපයුමට අදාළ ප්‍රමාණ පත්‍ර සංශෝධනයන් සිදුකර නොතිබීමෙන් රජයට වැඩිපුර මුදලක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවීමට සිදුව තිබුණි. නිවාස ඒකකයන්ට ජල සම්බන්ධතාව ලබා දීම සඳහා රු. 930,000 ක් ගෙවා තිබුණ ද තවමත් අත්තිවාරම් මට්ටම හෝ ආරම්භ නොකරන ලද නිවාස 18 ක් පැවතුණි.

(ඈ) ජල සැපයුම් ලබා දීමට අදාල මුල් අවබෝධතා ගිවිසුමේ 05 කොටසේ සඳහන් පරිදි ව්‍යාපෘතිය නිමකර බාරදීමට අදාළ ලේඛන ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් භාර දී නොතිබුණු අතර නිමකළ ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු කිරීම සඳහා ප්‍රජා පදනම් වූ සංවිධානයක් (Community Based Organization) අමාත්‍යාංශය විසින් මේ දක්වා පත්කර නොතිබුණි.

4.1.3.8 තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 917 ක් වූ පිටිපන තලගල (අදියර 1) මාර්ගය හා බටහිර අන්තර් හුවමාරු මාර්ගය සංවර්ධන ව්‍යාපෘති සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු.මිලියන 1,369.21 ක් වැයකර තිබුණි. ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටලුවක් හේතුවෙන් මෙම මාර්ගයන්හි වැඩ අවසන් කිරීමට නොහැකිව ව්‍යාපෘති අවසන්කර තිබුණි. ඒ හේතුවෙන් මාර්ගය ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා දරන ලද වියදම ද නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත කරුනු නිරීක්ෂණය විය.

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය, නැගෙනහිර පළාත, බස්නාහිර පළාත හා කොළඹ නගරය වශයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2023 දෙසැම්බර් 14 දින ඇමෙරිකානු ඩොලර් 410,000 කට සමාන රු. 137,098,311 ක මුදලක් ගෙවීම් කර තිබුණු අතර ඉහත කාර්යයට ඇතුළත් බස්නාහිර පළාත හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් 2018 වර්ෂයේ දී සකස්කර තිබුණු සැලසුම් වර්ෂ කීපයක් යනතුරු භාවිතයට නොගෙන නැවතත් සමාලෝචන සැලසුම් ලෙස නැවත සකස් කිරීමට එම ආයතනයම තෝරා ගැනීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ආ) ජාතික අයවැය වක්‍රලේඛ අංක 03/2022 හි iii ඡේදය අනුව, අඩක් නිමකර තිබුණු බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අන්‍යෝන්‍ය එකඟතාවය මත 2023 ජනවාරි 08 දින අවසන් කර තිබුණි. නමුත් බිල්පත්වලට ගෙවීමේ දී සිදුකරනු ලබන ගැලපීම් පිලිබඳව හෝ රැඳවුම් මුදල් හා කාර්යසාධන බැඳුම්කර නිදහස් කිරීම සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට පැමිණ නොතිබුණ ද, 2023 මාර්තු 17 දින රැඳවුම් මුදලින් රු. 5,858,352 ක් (වැට් සහිතව) කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. කාර්ය සාධන සුරක්ෂණය ද 2023 දෙසැම්බර් 31 දින වන විට කල් පිරී තිබුණ ද එහි කාලය දීර්ඝ කිරීමට කටයුතුකර නොතිබුණි. කෙසේ වුව ද පසුකාලීනව මෙම ව්‍යාපෘතිය සක්‍රිය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් 2024 දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණු බැවින් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් මෙතෙක් දරන ලද රු. 248,789,106 ක මුදල නිශ්කාර්යය වියදමක් වී තිබුණි.

(ඇ) රු.මිලියන 294.33 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත 2021 ඔක්තෝබර් 15 වැඩ ආරම්භකර 2023 දෙසැම්බර් 15 දින වැඩ නිමකිරීමට ගිවිසුම්ගතව තිබුණු අම්පාර සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය සියයට 52 ක භෞතික කාර්යසාධනයක් හා රු. මිලියන 64.27 ක මූල්‍ය කාර්යසාධනයක් ළඟාකර ගැනීමෙන් අනතුරුව වැඩ නවතා තිබීම හේතුවෙන් ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඈ) රු.මිලියන 83.60 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත 2021 ඔක්තෝබර් 06 දින වැඩ ආරම්භකර 2023 අගෝස්තු 31 දින වැඩ නිමකිරීමට තිබූ මාලිම්බොඩ වතු නිවාස ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන විට සියයට 35 ක භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන තිබූ නමුත් 2024 වර්ෂය සඳහා කිසිදු කාර්ය සාධනයක් ළඟා කරගෙන නොතිබුණි.

(ඉ) රු.මිලියන 10 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ බද්දේගම පදික වේදිකා ඉදිකිරීමේ ව්‍යාපෘතිය මුළුමනින්ම අතහැර දමා තිබුණි.

(ඊ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 පෙබරවාරි 08 දින වැඩ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 39,057 ක් වූ නිවාස 1768 කින් යුතු නිවාස ව්‍යාපෘති 06 ක් 2023 දෙසැම්බර් 31 දිනට සියයට 23 කට අඩු කාර්ය සාධනයයක් ළඟා කරගෙන තිබිය දී අතරමඟ නවතා දමා තිබුණි.

4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

යාපනය නගර සභා ගොඩනැගිල්ල නැවත ගොඩනැගීම සඳහා රු. මිලියන 2,142.48 ක කොන්ත්‍රාත් වටිනාකමකට ඉංජිනියරිං සර්විසස් පුද්ගලික සමාගම වෙත පවරා තිබුණි. ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 10 දින ආරම්භ කර 2021 ඔක්තෝබර් 09 දින නිම කිරීමට සැලසුම් කර තිබුණු නමුත් නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණු බැවින් 2024 ඔක්තෝබර් 09 දින දක්වා දින 1,125 ක දින දීර්ඝ කිරීම් 04 ක් ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 3,769 දක්වා රු. මිලියන 1,627 කින් වැඩිකිරීමට කටයුතු කර තිබුණි. මහා පරිමාණ ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වෙගවත්කිරීම(RAMP) සම්බන්ධව 22/1286/604/022 හා 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති නියෝග පරිදි මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ වගකීමත් සමඟම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණ ද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර නැවත අදියර 1 හා 2 වශයෙන් කොටස් 2 ක් යටතේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය වෙනුවෙන් රු. මි. 400 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර රු. 183,496,892 ක මුදලක් වියදම් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 85 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 1819.64 ක් වී තිබුණි.

ව්‍යාපෘතිය ආරම්භකර වසර 6 කට ආසන්න කාලයක් ගත වී ඇතත් මේ වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් නොවීම හේතුවෙන් 2024 අගෝස්තු 26 දිනැති ජාතික මෙහෙයුම් මැදිරි කමිටු (NOR) තීරණය අනුව 2025 වර්ෂය වෙනුවෙන් තවත් රු. මි. 400 ක් ප්‍රතිපාදන ලබාදීමට එකඟ වී තිබුණි. එසේ වුවත් සමස්ථ ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය ඉතිරි වැඩ කොටස් සඳහා උපදේශක ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කිරීමට සහ ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතියේ අධීක්ෂණ හා උපදේශන ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය සතුව ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැතිවීම මෙම ව්‍යාපෘතියේ දුර්වල කාර්යය සාධනයට බෙහෙවින් බලපා තිබුණු නමුත් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා එම ආයතනයට උපදේශන ගාස්තු ලෙස රු. 98,665,480 ක මුදලක් ගෙවා තිබුණි.

4.2 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 75/10/5068 හා 2023 අගෝස්තු 23 දිනැති ලිපිය සහ 2023 අගෝස්තු 15 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/APP/17/5/20/2022 හා 2023 අගෝස්තු 15 දිනැති ලිපිය මගින් 2021.10.21 සිට 2023.12.31 දක්වා කාල සීමාව සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) තනතුරෙහි පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා සහකාර ලේකම්වරයකු පත්කර තිබුණි. තව ද එම නිලධාරියා වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වැඩබැලීම සඳහා පත්කර තිබුණු අතර 2022 ජනවාරි සිට 2023 සැප්තැම්බර් කාලසීමාව සඳහා ඔහුට අනුයුක්ත කර තිබුණු අංක PK – 7096 ඩබල් කැබ් රථයට තම පෞද්ගලික මුදලින් ඉන්ධන සඳහා වැය කළ බව සඳහන් කරමින් ඉල්ලුම් කළ රු. 923,812 ක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් 2023 ඔක්තෝම්බර් 20 දින ගෙවා තිබුණි. නමුත් මෙම නිළධාරියා විසින් නිල වාහනයක් භාවිතා කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් හෝ පෞද්ගලික මුදලින් ඉන්ධන සපයා ගැනීමට සහ ප්‍රතිපූරණය කරගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලබාදුන් අනුමැතියක් හෝ අදාල කාලය තුළ PK-7096 ඩබල් කැබ් රථයට තම පෞද්ගලික මුදලින් ඉන්ධන සඳහා රු. 923,812 ක් වැයකල බවට කිසිදු තහවුරුවක් හෝ විගණනයට ඉදිරිපත් ඉදිරිපත් නොවීය.

තව ද වර්තමානයේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන හා නඩත්තු) ලෙස රාජකාරී කටයුතු කරන මෙම නිලධාරියා 2023 ජනවාරි 23 දින සිට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ලෙස වැඩබැලීමේ තනතුරක් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කර තිබුණි. නමුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 හි 05 ඡේදයට පටහැනිව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් 2023 ජනවාරි 27 දින සිට 2024 නොවැම්බර් 18 දින දක්වා මාස 23 කට ආසන්න කාලයක් වෙනුවෙන් එම අධිකාරියේ සංචිත වාහන ද යොදා ගනිමින් ප්‍රවාහන පහසුකම් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා එම අධිකාරිය විසින් රු. 2,629,635 ක මුදලක් ඉන්ධන සඳහා පමණක් වැයකර තිබුණි.මීට අමතරව එකී රියදුරන් වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවා තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව රජයේ මුදල් වැයකර තිබුණි.

4.3 අනාර්ථික ගනුදෙනු

පහත කරුනු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් නුවරඑළිය නානු ඔයෙහි ඉවුර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු. 107,302,029 (බදු රහිත) ක වටිනාකමකට කොන්ත්‍රාත් ආයතනයක් වෙත පිරිනමා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 29 දින ආරම්භ කර දින 365 කින් එනම් 2022 සැප්තැම්බර් 28 දින නිමකිරීමට ගිවිසුම්ගත වී තිබුණු අතර මේ සඳහා 2021 ඔක්තෝබර් 10 දින

රු. 16,342,579 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ද ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු පසුකාලීනව ඇති වූ ආර්ථික අර්බුධකාරී තත්වය හමුවේ කොන්ත්‍රාත්කරුට නියමිත දිනට නිමකිරීමට නොහැකි වී තිබුණු අතර දින දීර්ඝ කිරීම් 02 ක් අනුමත කළ ද ගිවිසුම්ගත කාර්යයභාරය අවසන් කරවා ගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වුව ද 2022 ජූලි 26 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී ඵළැඹී තීරණයක් අනුව, මෙහි විෂය පථය සීමාකර නානු ඔයේ පැති බැම්ම ඉදිකිරීමේ කොටස පමණක් අවසන් කර 2023 ඔක්තෝම්බර් 25 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු. 47,243,141 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.

අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයට අනුව 2022 ජූලි 26 දින අමාත්‍යාංශයේ ලේකම් විසින් ඵළැඹී තීරණයක් අනුව, ව්‍යාපෘතියේ විෂයපථය සීමා කර නානු ඔයෙහි පැති බැම්ම පමණක් ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දී තිබුණ ද එම උපදෙස් අනුව පැතිබැම්ම සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ඉවුරේ ඇතැම් ස්ථාන වැලි හා අපද්‍රව්‍යවලින් වැසී ගොස් තිබුණි. තවද නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකරන බැවින් ව්‍යාපෘතිය නිමකර වසරක් ගත වීමටත් පෙර නානු ඔයේ ජලය ගලායාම අවහිර වී තිබුණු බැවින් , මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ රු.47,243,141 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

(ආ) සියක් නගර සංවර්ධන වැඩසටහන යටතේ වලපනේ බහුකාර්ය ගොඩනැගිල්ල හා සනිපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 118,890,369 (වැට් රහිත) ක කොන්ත්‍රාත් වටිනාකමක් මත කොන්ත්‍රාත් සමාගමක් වෙත පිරිනමා තිබුණි. මෙහි වැඩ කටයුතු 2021 සැප්තැම්බර් 28 දින ආරම්භ කර 2022 සැප්තැම්බර් 27 දින අවසන් කළ යුතු වුව ද 2022 නොවැම්බර් 11 දක්වා දින දීර්ඝ කර තිබුණි. කෙසේ වුව ද එදින වන විට ද මෙම ව්‍යාපෘතියේ ගිවිසුම්ගත වැඩකටයුතු නිමකළ නොහැකි වී තිබුණ ද 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2022 මගින් ලබා දී ඇති උපදෙස් අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් රු. 48,940,924 ක වැඩ අවසන් වටිනාකමක් මත මෙම ව්‍යාපෘතිය අවසන් කර, 2022 නොවැම්බර් 11 දින භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ 2021/2022 කාලසීමාව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට නිහිපතා වසා දැමීම හේතුවෙන් මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණපා සිටි කාලයක් බැවින් එවැනි කාල වකවානුවක අත්‍යාවශ්‍ය නොවූ සහ සතියකට එක් වතාවක් පමණක් පැවැත්වෙන පොළක් ඇතුළුව, අවශ්‍යතාවය හඳුනා නොගත් බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කිරීම නිසා ඉහත දැක්වෙන පරිදි ව්‍යාපෘතිය අතරමග

නැවතීමට සිදුව තිබුණු අතර මෙම ව්‍යාපෘතිය නිම නොකර අතහැර දැමීම හේතුවෙන් ඒ වෙනුවෙන් වැය කළ රු. 48,940,924 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

(ii) මෙහි කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය වක්‍රලේඛ 03/2022 හි, අංක iii ඡේදය අනුව, අඩක් නිමකළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවීමේ දී එම යටිතල පහසුකම් භාවිතා කරන ජනතාවට වන අපහසුතා අවම වන පරිදි අවසන් කළ යුතු වුව ද, මෙම ව්‍යාපෘතියේ අඩක් නිමකළ ගොඩනැගිල්ල තුළට වැසි ජලය ගලා එන බැවින් මෙම භූමියේ පවත්වනු ලබන සතිපොළ භූමිය වැසි දිනවල දී මඩගොහොරුවක් වීම නිසා ජනතාව දැඩි අපහසුතාවයට ලක්වී තිබුණි.

(iv) අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සහ කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතාවය මත ගොඩනැගිල්ලේ මූලික ඇස්තමේන්තුව(BOQ) අනුව, ගොඩනැගිල්ලේ පාදම, ගේජ් 1000 පොලිතීන් පටලයක් සහිත මිලි මීටර් 100 ඝනත්වයකින් යුතු A 142 BRC දැලක් සහිතව වර්ග මීටර් 450 කොන්ක්‍රීට් කිරීමට සැලසුම් කර තිබුණ ද, එම කොටස සම්පූර්ණයෙන්ම අතහැර තිබුණු අතර මිලි මීටර් 100 ක ඝණකමින් යුතු, වර්ග මීටර් 100 ක කොන්ක්‍රීට් තට්ටුවක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබූණ ද එම ප්‍රමාණය වර්ග මීටර් 415.93 ක් දක්වා වැඩි කර ඉදිකිරීම් කටයුතු සිදුකිරීම සඳහා රු. 2,369,475 ක් වැයකර තිබුණි.

(ඇ) නුවරඑළිය පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 49,704,479 (බදුසහිත) ක කොන්ත්‍රාත් වටිනාකමක් මත පෞද්ගලික සමාගමකට 2018 ජූලි 06 දින ලබා දී තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කර 2019 ජනවාරි 16 දින අවසන් කළ යුතුව තිබුණි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු එදිනට නිම කිරීමට නොහැකිවීම නිසා අමාත්‍යාංශය විසින් 2019 සැප්තැම්බර් 28 දක්වා දින දීර්ඝ කිරීම් 7 ක් අනුමත කර තිබුණි. 2020 සැප්තැම්බර් 14 දින ව්‍යාපෘතියේ වැඩ අවසන්කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 54,623,050 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 7 වන දින දීර්ඝ කිරීම සඳහා 2020 ජූලි 10 දක්වා දින 265 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණු අතර උපදේශන ආයතනය විසින් දින 256 ක් නිර්දේශ කර තිබුණි. නමුත් 2019 දෙසැම්බර් 15 දින දක්වා දින 48 ක් පමණක් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර තිබුණු අතර ඉතිරි ප්‍රමාද කාලය සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රමාද ගාස්තු ලෙස රු. 4,322,128 ක් අයකර තිබුණි. කෙසේ වුව ද දින දීර්ඝ කිරීමේ අයදුම්පත්‍රය වැඩ නිම කළ යුතු දිනට පෙර

අනුමත කළ යුතු නමුත් 7 වන දින දීර්ඝ කිරීම, අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණේ 2020 දෙසැම්බර් 01 දින, එනම් වසරකට ආසන්න කාලයකට පසුවය.

(ii) ප්‍රමාද ගාස්තු අයකිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් අමාත්‍යාංශයට එරෙහිව ආරවුල් නිරවුල් කිරීමේ විනිශ්චය මණ්ඩලයේ(DAB) නඩු පවරා තිබුණි. එම තීන්දුව අනුව, වැඩිපුර අඩුකරන ලද ප්‍රමාද ගාස්තු හා ඊට අදාළ පොලිය ලෙස කොන්ත්‍රාත්කරු වෙත රු.5,308,574ක් අමාත්‍යාංශය විසින් 2024 ජූලි 22 දින ගෙවා තිබුණි. ආරවුල් නිරවුල් කිරීමේ විනිශ්චය මණ්ඩලය(DAB) හමුවේ අමාත්‍යාංශයේ නිර්දෝෂිභාවය ඔප්පු කිරීමට හැකි ශක්තිමත් නීති නිලධාරීන් පත්කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වීම හේතුවෙන් අමාත්‍යාංශයට ඉහත පරිදි අතිරේක වියදමක් දැරීමට සිදුව තිබුණි.

(ඇ) නැනෝ + ආර්ඕ තාක්ෂණය යොදා ගනිමින් පානීය ජලය ලබාදීමේ වැඩසටහනට අදාල රු. 219,070,113 ක් 2024 දෙසැම්බර් 31 දින වනවිට ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණි. 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා රු. 188,087,881 ක මුදලක් වැය කර වවුනියාව කිලිනොච්චි හා මුලතිව් යන දිස්ත්‍රික්කවල ජල පිරිපහදු පද්ධතීන් 50 ස්ථාපිත කර තිබුණ ද ඒවා ක්‍රියාකාරී තත්ත්වයට පත්කර වකුගඩු රෝගීන් වෙත ලබාදීමට අමාත්‍යාංශය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් එම වත්කම් ඌන උපයෝජිතව පැවතුණි.

4.5 විගණන විමසුම්වලට ප්‍රමාද වී පිළිතුරු ලබාදීම

අමාත්‍යාංශය වෙත 2024 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 20 කට පිලිතුරු ලබාදීමේ ප්‍රමාදයක් පැවති අතර ප්‍රමාද කාලය දින 19 සිට 310 දක්වා අතර කාල පරාසයක පැවතුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත කරුනු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ "සියක් නගර" නාගරික යටිතල පහසුකම් හා නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුරුණෑගල රජපිල්ල නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු. මිලියන 136,723,845 (බදු රහිත) ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත පුද්ගලික සමාගමක් වෙත 2021 සැප්තැම්බර් 23 දින පිරිනමා තිබුණි. 2021 සැප්තැම්බර් 30 දින ආරම්භකර 2022 ඔක්තෝබර් 01 දින අවසන් කිරීම සඳහා ගිවිසුම්ගත වූ මෙම ව්‍යාපෘතිය ගිවිසුම්ගත කාලවකවානුව තුළ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වීම නිසා 2023 නොවැම්බර් 30 දින දක්වා දින 426 ක් සඳහා දින දීර්ඝ කිරීම් 04 ක් අමාත්‍යාංශය විසින් අනුමත කර තිබුණු

අතර 2023 නොවැම්බර් 30 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කර මාස 03 කට පසු 2024 මාර්තු 15 දින කුරුණෑගල මහ නගර සභාව වෙත භාර දී තිබුණි. විගණිත දිනය වන විට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රු. 164,128,068 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2020 දෙසැම්බර් 10 දිනැති හා අංක NP/PP/PUT/URD/20/22 දරන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් මෙම ව්‍යාපෘතියේ අදියර 01 කොටස අමාත්‍යාංශයට වෙන්කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 24.30 ක වියදම් සීමාව තුළ සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු රු. මිලියන 136.72 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණු අතර ඉදිකිරීම් කටයුතු නිම කළ අවස්ථාව වන විට මෙහි මුළු පිරිවැය රු. මිලියන 169.9 ක් වී තිබිණි. තව ද අදියර 01 හි අනුමත සීමාව ඉක්මවීමට සහ අදියර 02 සඳහා වැයවන මුදල සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. තව ද අමාත්‍යාංශය විසින් 2024 මාර්තු 25 දින වන විට කොන්ත්‍රාත් ආයතනයට රු. 164,128,068 ක මුදලක් ගෙවීමේ දී මු.රෙ.136 හා 138 යන රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) 2021 නොවැම්බර් 17 දිනැති අංක 03/2021 දරන ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව, මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ප්‍රථම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබෙදැයි සොයාබැලීමට යටත්ව වුව ද, ඒ අනුව කටයුතු නොකර කොන්ත්‍රාත්තුව 2021 සැප්තැම්බර් 23 දින කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණි. තව ද 2024 දෙසැම්බර් 31 දිනය වන විට ව්‍යාපෘති කටයුතු ආරම්භකර වසර 04 ක් පමණ ගත වී තිබුණ ද, මේ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට ද අමාත්‍යාංශය විසින් කටයුතුකර නොතිබුණි.

(iii) රු. 1,198,829 ක වියදමක් මත අලුත්වැඩියා කරන ලද පැරණි කාර්යාල ගොඩනැගිල්ල නිශ්කාර්යව වසා දමා තිබුණි. උද්‍යාන පරිශ්‍රයේ පිහිටි ලිඳෙන් ජලය පොම්පකර උද්‍යානයට ජලය සපයා ගැනීම සඳහා රු. 3,711,799 ක් හා රු. 2,454,813 ක් වැයකර Water cascade and Pump room එකක් සහ Water tower ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණ ද ඒවා භාවිත කළ නොහැකි වී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට උද්‍යානයට ජලය නල මඟින් සපයා ගැනීම සඳහා රු. 6,166,612 ක මුදලක් අමතරව දැරීමට සිදුවී තිබුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

තලවාකැලේ නගරය හූ අලංකරණ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රු. 16,147,252 (බදුරහිත) ක් වැය කර තිබුණු අතර එම භූමිය හා ඇවිදීමේ මංතීරුව කිසිදු නඩත්තු කටයුත්තක් සිදු නොකිරීම හේතුවෙන් වල්බිහිවී තිබුණු අතර ව්‍යායාම සඳහා භාවිතා කළ නොහැකිව තිබුණි. තව ද එම භූමියේ ගස් 135 ක් සිටුවීම සඳහා රු. 275,000 ක් සහ කොන්ක්‍රීට් බංකු 4 ක් ඉදිකිරීම සඳහා රු. 60,000 ක් වැය කර තිබුණ ද, එවැනි ගස් සිටුවීමක් හෝ බංකු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව, මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත තලවකැලේ නගරය වෙත සංචාරකයින් ආකර්ෂනය කරගැනීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයා වෙත ද ලැබී නොතිබුණි.

එස්.සංජීව
ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.